# Holiday Assignments

READING PACK

**ADVANCE LEVEL**

**Subject: Political Science** **Grade 12 & 13** **Medium: Sinhala**

## සම්භාව්‍ය ලිබරල්වාදයේ න්‍යාය හා භාවිතය පිළිබඳව විග්‍රහයක් සපයන්න.

රාජ්‍යය, දේශපාලනය සහ පුරවැසියා පිළිබඳ නූතන දේශපාලන පරිකල්පනයට විශේෂයෙන් බලපා ඇති අදහස් පද්ධතියක් වන්නේ රාජ්‍යය පිළිබඳ ලිබරල් න්‍යායයි. නූතන ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයේ හැඩගැසීම, ආයතනික ව්‍යුහය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවාදයට හා භාවිතාවන්ට මෙම ලිබරල් න්‍යාය නොයෙක් ලෙස බලපා ඇත. සාම්ප්‍රදායික වැඩවසම් සමාජ ආර්ථික ක්‍රමය අහෝසි කරමින් 17 සහ 18 යන සියවස්වල යුරෝපා සමාජයෙන් මතුකළ ධනේෂ්වර විප්ලව හා පිබිදුනු ජාතික විමුක්ති අරගලවලින් පසු සමාජයේ වෙළඳාම, වාණිජ්‍යය සහ කර්මාන්ත වර්ධනය සිදුවිය. ඒත් සමගම ධනවාදය නමින් හැඳින්වුණු සම්පූර්ණයෙන්ම අලුත් සමාජ ආර්ථික ක්‍රමයක් ගොඩ නැගුණි. ලිබරල්වාදය ආර්ථික න්‍යායක් වශයෙන්ද දේශපාලන දර්ශනයක් වශයෙන්ද සමාජ මතවාදයක් වශයෙන්ද කළේ මෙම අතිමූලික පරිවර්තනය ප්‍රකාශකිරීමයි. ඒ නිසාම ධනවාදී සමාජ ක්‍රමයේ ආරම්භය පිළිබඳ කෙටියෙන් හෝ සාකච්ඡා නොකර ලිබරල්වාදය පිළිබඳ විග්‍රහ කළ නොහැක.

වැඩවසම් අර්ථ ක්‍රමය තුළ නිෂ්පාදන සබඳතාව රදළ හා ප්‍රවේණිදාස ලෙස ක්‍රියාත්මක වූ අතර එහිදී ප්‍රවේනිදාසියා රදළයාගේ වහලෙකු සේ වූ අතර ශ්‍රමය නිදහස් එකක් නොවිය. ධනවාදී සමාජ අර්ථක්‍රමය වැඩවසම් සමාජ ක්‍රමය තුලින්ම පෙර නිමිති පහල කල අතර පැවති සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් ඔබ්බට ගොස් හස්ත ක්මාන්තය ගොඩ නැගුණු අතර සමාජයේ ඉල්ලුම විසින් නව වෙළඳපොළක අවශ්‍යතාවය මතුවන්නට විය. ඊට ශ්‍රම ඉල්ලුමක් අවශ්‍ය වූ නිසාම නව කාර්මික ධනපති පන්තියක් බිහිවිය නව සොයාගැනීම් විද්‍යාත්මක හා තාක්ෂණික දියුණුව සංවර්ධනය වෙමින් ආ හස්ත කර්මාන්තය කාර්මීකරණයක් දක්වා රැගෙන ආ අතර ඒත් සමඟ බන්ධනයන්ට යටත්ව සිටි ප්‍රවේණිදාසයන් නගරයට ඒකරාශි විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස දැවැන්ත ආර්ථික ප්‍රසාරණයක් සිදු වූ අතර පැවති සංස්කෘතික බන්ධනය තවදුරටත් වළංගු නොවිය. ඒ වෙනුවට අවශ්‍යය වූයේ නිදහස් ශ්‍රමය, ආර්ථික මෙන්ම දේශපාලන මධ්‍යගතභාවයයි. කාර්මිකරණයේ කුළුදුල් දරුවා වූ නව ධනපති පන්තියට රාජ්‍යය බලය නොමැතිව සිය නිෂ්පාදනය හා බෙදාහැරීම සිදුකල නොහැකි වූ අතර පන්තිමය අවශ්‍යතාව මත කම්කරු පන්තිය සම්බන්ධ කරගනිමින් ධනපති පන්ති විසින් ධනේෂ්වර විප්ලවය සිදු කරයි. ධනපතියන් විසින් රාජ්‍යබලය ලබා ගනිමින් ජාතික රාජ්‍ය බිහිකරගැනිම සඳහා ලොව පුරා ප්‍රධාන උපක්‍රම හතරකි ඒ,

1) ධනේෂ්වර විප්ලවයක් මගින් ජාතික රාජ්‍ය බිහි කර ගැනීම.

2) ජාතික විමුක්ති අරගල මගින් ජාතික රාජ්‍ය බිහිකර ගැනීම.

3) ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදි විප්ලව මගින් ජාතික රාජ්‍ය බිහිකර ගැනීම.

4) ධනවාදය උත්තරාරෝපණය කිරිම මගින් ජාතික රාජ්‍ය බිහිකර ගැනීම.

(අබේරත්න, 2007)

මෙලෙස ධනපතික්‍රමය සමඟ ගොඩනඟන ජාතික රාජ්‍යයේ දේශපාලන මතවාදය බවටපත් වුයේ ලිබරල්වාදයයි. මතවාදයක් ලෙස ලිබරල්වාදය විධිමත් ලෙස ආරම්භ වන්නේ හොබ්ස්, ලොක් හා රූසෝ විසින් දක්වන ලද අදහස්වල බලපෑමෙන්ය. විශේෂයෙන් පෞද්ගලික දේපොල සම්බන්ධව ජොන් ලොක්ගේ අදහස් ලිබරල්වාදයේ පදනම ලෙස හඳුනාගත හැක. ජීවිතය, දේපල, නිදහස පිළිබඳ ඔවුන්ගේ අදහස් එහිලා වැදගත් විය.

මේ අයුරින් ධනවාදී සමාජ ක්‍රමයේ දේශපාලන මතවාදය වශයෙන් දේශපාලන කරළියට පැමිණි ලිබරල්වාදය ධනපති ක්‍රමයේ විකාශනය සමඟ කාලානුරූපීව සංශෝධනය වෙමින් හා ප්‍රතිසංස්කරණයට භාජනය වෙමින් රාජ්‍ය පිළිබඳ ලිබරල් මතය ඉදිරියට පැමිණ තිබේ. ධනපති ක්‍රමයේ පරිණාමයට සාපේක්ෂව එහි දේශපාලන මතවාදය වු ලිබරල්වාදය අවස්ථා තුනක දී ප්‍රතිසංස්කරණය වි තිබේ.

01) සම්භාව්‍ය ලිබරල්වාදය. (Classical Liberalism)

02) නුතන ලිබරල්වාදය. (Modern Liberalism)

03) නව ලිබරල්වාදය. (Neo Liberalism)

මේ අතරින් මෙම රචනය තුළ අවදානය කරනු ලබන්නේ සම්භාව්‍ය ලිබරල්වාදය පිළිබඳවයි. 18 වන සියවසේ මුල්භාගයේදී පැතිර ගිය ලිබරල්වාදය මෙම සම්භාව්‍ය ලිබරල්වාදයයි. මෙය මුල් ලිබරල්වාදය, පැරණි ලිබරල්වාදය ලෙසින්ද හඳුන්වනු ලබයි. සම්භාව්‍ය ලිබරල්වාදය තුළින් ඉදිරිපත් කරන මුලිකම අදහස වන්නේ රාජ්‍ය ආර්ථික කටයුතුවලට මැදිහත් නොවීම හා බාධා නොකිරිම මගින් පෞද්ගලික ව්‍යවසායකයන් හට ආර්ථික ක්‍රියාවලියට පිවිසීමට හා පවත්වාගෙන යාමට නිදහස් අවකාශය ලබාදිමයි. එය ලිබරල්වාදය බිහි වු මුල්කාලයේදි සිදුවිය. මෙලෙස රජය ආර්ථිකයට මැදිහත් නොවිම රාජ්‍ය නිර්බාධවාදය යනුවෙන් හඳුන්වන අතර සම්භාව්‍ය ලිබරල්වාදයේ රාජ්‍ය ප්‍රතිපත්තියද එයම විය. විශේෂයෙන් සම්භාව්‍ය ලිබරල්වාදය තුළ රජය එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලද්දේ ධනේශ්වර ආර්ථික ක්‍රමය වර්ධනය කිරිම සඳහාය. ධනවාදය බිහි වු මුල් යුගයේ එය වර්ධනය කිරිම සඳහා රාජ්‍ය නිර්බාධවාදි ප්‍රතිපත්තිය අනුගමනය කල අතර එයට අවශ්‍යය වු න්‍යායාත්මක දේශපාලන මතවාදය ලිබරල්වාදය මගින් සැකසු නිසා ලිබරල්වාදය ධනේශ්වර පන්තියේ දේශපාලන මතවාදය ලෙස හැඳින්වීම වඩාත් උචිතය.

පල්ලිය හා සදාචාරය ධනය ඉපයීමට බාධාවක් විය. එම නිසා මාටින් ලුතර් හා ජෝන් කැල්වින් යන දෙදෙනාගේ මුලිකත්වයෙන් ක්‍රියාත්මක වු ප්‍රොතෙස්තන්ත ආගමික ව්‍යාපාරය හරහා කතෝලික දෘෂ්ටිවාදයට හා පල්ලියේ සම්මතයන්ට විරුද්ධව යම් කාර්යභාරයක් සිදු කරන ලදී. මේ අනුව අලුත උපන් ධනපති පන්තියට ධනය රැස්කිරිමට අවශ්‍යය දේශපාලන රැකවරණය රජුගෙන් ලබාගන්නා අතර

ධනවාදයේ ආරම්භක අවස්ථාවේ පවා ඒ සඳහා ප්‍රබල රාජාණ්ඩුක්‍රමයක් අවශ්‍යය විය. ඒ සඳහා න්‍යායාත්මක පදනම මැකියාවෙලි හා තෝමස් හොබ්ස් විසින් ලබාදෙන ලදී. එහෙත් ආරම්භය එසේ වුවද වැඩිකලක් යන්නට මත්තෙන් 17 වන සියවසේ දී රජු හා ධනපති පන්තිය අතර ගැටුම හටගනී. යටත්විජිත ආක්‍රමණය කිරීමේදී රාජාණ්ඩුවට අවශ්‍යය මුදල් සම්පාදනය කරගැනීමට ධනපති පන්තිය මත බදු පනවන රජු බදු නොගෙවන ධනපති ව්‍යාපාරිකයන් සිරගත කිරීම හා දේපල පවරා ගැනීමට කටයුතු කලනිසා ධනපති පන්තියේ ආර්ථික හා දේශපාලන නිදහසට රාජාණ්ඩුවේ බලය තර්ජනයක් විය. එබැවින් ධනපති පන්තියේ නායකත්වය යටතේ ධනේෂ්වර සහ ධනේෂ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලව හරහා රාජාණ්ඩු ක්‍රමය පෙරලා දැමීමටත් සමුහාණ්ඩු පිහිටුවාගෙන එයට ව්‍යවස්ථානුකූලවාදයක් යොදා ගැනීමටත් කටයුතු සිදුවන ලදී.

මෙලෙස ආණ්ඩු පාලනය සම්මත නීති හා රීතීත්ව යටත් කිරීම නිසා ආණ්ඩුවේ බලය සීමා වු අතර පෙර පැවති රාජාණ්ඩු ක්‍රමයේදී මෙන් පාලනය ධනපති පන්තිය කෙරෙහි ප්‍රතිවිරෝධතාවක් නොදක්වන ලදී. ඒ අනුව සම්භාව්‍ය ලිබරල්වාදය තුල රාජ්‍ය නිර්බාධවාදය හෙවත් අඩුවෙන්ම පාලනයට සම්බන්ධවන රජය හොඳම රාජ්‍ය බවට පත්විය. අවම රාජ්‍ය ක්‍රමය තුළ රජයට පැවතුනේ ප්‍රධාන කාර්යයන් දෙකක් පමණි. එනම්,

01) නීතිය හා සාමය ආරක්ෂා කිරීම. (යුක්තිය)

02) බාහිර උවදුරුවලින් ජනතාව බේරා ගැනීම.

මේ අනුව සම්භාව්‍ය ලිබරල්වාදය තුළ රාජ්‍ය එක්තරා ආකාරයක පොලිස් නිළධාරියෙකුගේ භූමිකාව සමඟ ගලපන ලදී. අනෙක් අතට රාජ්‍ය යුක්තිය ඉටු කිරීමේදී විනිසුරුවෙකුගේ භූමිකාව නිරූපණය කළේය.

සම්භාව්‍ය ලිබරල්වාදීන්ට අනුව මිනිසාගේ පෞද්ගලිකත්වය අති ශ්‍රේෂ්ඨ දෙයකි. මිනිසාගේ ස්වාධින කැමැත්ත, සමාජයේ සමානාත්මතාව, පුද්ගල අයිතිවාසිකම්, විශේෂයෙන්ම දේපල උපයාගැනීමට හා රැස් කිරීමට මිනිසාට ඇති අයිතියද ඉතාමත් තාර්කික දෑ වන අතර මිනිසාට අහිමි කල නොහැකි දෑ වේ. (දේශපාලන විද්‍යාව, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 2003) පුද්ගලයා හා රාජ්‍ය අතර පවත්නා ගිවිසුම කඩකල විට ඊට එරෙහි වීමට මිනිසාට අයිතියක් ඇත. සමාජයේ සාමය හා නිතිය රැකීම රාජ්‍යයේ උත්තරීතර කාර්යය වන අතර ඒ සඳහා නීති යොදාගැනේ. එහෙයින් නීති ශ්‍රේෂ්ඨ කොට සැළකේ. රාජ්‍යය පාලනයේ සීමාවක් පැවතිය යුතුය. අඩුවෙන්ම පාලනය කරන රාජ්‍ය හොඳම රාජ්‍ය වශයෙන් සැළකු අතර සියළු පුද්ගලයන්ට දේශපාලන, ආර්ථික, ආගමික, සාමාජිය සංවේදි හා බුද්ධිය මෙහෙයවීමේ ක්‍රියාකාරකම්වලදී පුද්ගල අයිතිවාසිකම් රැකීම සඳහා රාජ්‍ය විසින් සුදුසු පරිසරයක් ගොඩනගා දීම අනිවාර්ය වේ. එසේ වුවිට පමණක් මිනිසාට උපරිම නිදහස, සතුට හා අභිවෘද්ධිය ලගාකරගත හැකි බව මෙහිදි පිලිගත් සම්භාව්‍ය ලිබරල්වාදීන් රාජ්‍ය රාත්‍රි මුරකරුවෙකුගේ තත්වයට පත්කර ඇතැයි ප්‍රකාශ කරයි.

සම්භාව්‍ය ලිබරල්වාදය මතවාදයක් ලෙස ගොඩනැගිමේ දී එය එක් දාර්ශනිකයෙකුගේ අදහස් මත පදනම් නොවේ. එය දාර්ශනික අදහස් රාශියක එකතුවකි. ඒ අතර,

- ජෝන් ලොක්
- ජෝන් ස්ටුවර්ට් මිල්
- මොක්ටෙස්ක්‍යු
- ඇලෙක්සිද තොක්විල්
- ඇඩම් ස්මිත් ප්‍රධාන මතධාරීන් වේ.

මෙම චින්තකයන් විසින් සම්භාව්‍ය ලිබරල්වාදී මතවාදය පෝෂණය කිරීම පිණිස ගොඩනගන ලද න්‍යායික හරයන් විග්‍රහකරගැනීම එය තේරුම්ගැනිමෙහිලා අතිශය වැදගත් වේ. සම්භාව්‍ය ලිබරල්වාදි න්‍යායේ ප්‍රධාන මුලිකාංග කිහිපයක් ගොඩනැගීම වෙනුවෙන් එම න්‍යායික මතවාදයන් හරහා සිදුවී ඇත. ඒවා නම්,

- ❖ නිදහස පිළිබඳ විශ්වාසය (Presumption of Freedom)
- ❖ පෞද්ගලිකත්වය (පුද්ගල) ප්‍රමුඛතාව (The primacy of individualism)
- ❖ බලපෑම (බලහත්කාරය) අවම කිරීම. (Minimising Coercion)
- ❖ ඉවසීම (Toleration)
- ❖ සීමිත හා නියෝජිත ආණ්ඩු (Limited and representative Government)
- ❖ නීතියේ ආධිපත්‍ය (Rule of Low)
- ❖ ස්වයං පැවැත්ම (Spontaneous Order)
- ❖ වෙළඳපළෙහි ස්වභාවික බව ( Property of trade and market)
- ❖ සිවිල් සමාජය (Civil Society)
- ❖ පොදු මනුෂ්‍ය අගයකිරීම් (Comman Human Values)

මෙම න්‍යායික මුලධර්ම එක් එක් ප්‍රධාන චින්තක මතවාද සවිස්තර කිරීම් හරහා පැහැදිලි කරගත හැක.

**සම්භාව්‍ය ලිබරල්වාදය සහ ජෝන් ලොක්**

ජෝන් ලොක් සම්භාව්‍ය ලිබරල්වාදයට අදාළ න්‍යායික අදහස් ගොඩනැගු ප්‍රමුඛ මතධාරියෙකි. ලොක් 1690 දී පළකල Two Treatises on Government (ආණ්ඩුව පිළිබඳ රචනා දෙකක්) කෘතිය මගින් රාජ්‍ය පිළිබඳ ඔහුගේ අදහස් ගෙනහැර දක්වා ඇත. එහිදී ජෝන් ලොක් විසින් පුද්ගල නිදහස පිළිබඳ හොබ්ස්ගේ තර්කය මත පිහිටා එයට සංශෝධන එකතු කරමින් සිය ප්‍රවාදය ගොඩනගන ලදී. ඔහුට අනුව රාජ්‍යය පරමාධිපත්‍ය බලය ලබා තිබෙන්නේ කොන්දේසි සහිතව වන අතර රාජ්‍යයේ ප්‍රධාන පරමාර්ථය විය යුත්තේ පුද්ගලයන්ගේ ජීවිතය, නිදහස සහ දේපොල (Life, Liberty, Property)

ආරක්ෂා කිරිමයි. රාජ්‍යය බලය මහජනතාව විසින් පාලකයන්ට තාවකාලිකව පවරා දි ඇති බලයක් වන අතර එය අසීමිතව හෝ හිතුවක්කාරව පාවිච්චි කලහැකි දෙයක් නොවේ.

" රාජ්‍යයේ පරමාධිපත්‍ය යනු මහජන පරමාධිපත්‍යයෙන් ව්‍යුත්පන්න වූ ඒ නිසාම එයට යටත් එකකි ඒ අනුව රාජ්‍ය බලය " මහජන කැමැත්ත" (Popular Consent) ට යටත්ය." (උයන්ගොඩ, 2011)

මහජනතාව පවරා දෙනු ලබන බලය සීමිත බලයක් වනවා සේම එය එක් පුද්ගලයෙකු හෝ එක් ආයතනයක් මත කේන්ද්‍රගත නොවිය යුතු බව ලොක් පෙන්වා දෙයි. නීතිය පසිඳලීම, ක්‍රියාත්මක කිරිම යන කාර්යයන් ද්විත්වයම එකී තැනකට ඒකරාශි වීම තුළ ප්‍රජාවගේ යහපත බලාපොරොත්තු විය නොහැකි බවත්, එසේ වුවහොත් එය ඛේදාන්තයක් වනු ඇති බවටත් ලොක් තර්ක කරයි. එහිලා රාජ්‍යයේ උත්තරීතර ආයතනය වු ව්‍යවස්ථාදායකගේ පවා බලය සීමා කිරීමේ වැදගත්කම පෙන්වාදෙයි. උත්තරීතර ව්‍යවස්ථාදායකයේ බලය සිව්ආකාරයකින් සීමා වන බව ලොක් දක්වයි ඒ මෙසේය,

- ව්‍යවස්ථාදායකයේ පනවන නීති දුප්පත්, පොහොසත්, බලවත්, බලනැති ආදී භේදයකින් තොරව සැම දෙනාටම එකසේ ක්‍රියාත්මක විය යුතුය.
- නීතිය හිතුවක්කාර සහ ප්‍රජාපීඩක නොවිය යුතුය. නීති පැනවිය යුත්තේ මහජනතාවගේ හිතසුව පිණිසය.
- මහජනතාවගේ හෝ ඔවුන්ගේ නියෝජිතයින්ගේ හෝ අනුමැතිය නැතිව අයබදු පැනවීමේ හෝ වැඩි කිරිමේ බලයක් ව්‍යවස්ථාදායකයට නැත.
- ව්‍යවස්ථාදායකය තමන් සතු නීති පැනවිමේ බලය තවත් ආයතනයකට මාරු නොකල යුතුය.

(උයන්ගොඩ, 2011)

මේ ආකාරයට ජෝන් ලොක් බලය සිමා කිරිමේ ප්‍රවාදයේ බලවත්ම ප්‍රකාශකයා වුයේ කුමන භාවිතාවක් තුළද ? විශේෂයෙන් 17 වන සහ 18 වන සියවස්වලදී යුරෝපයේ පැවති සර්වබලාධිකාරි රාජාණ්ඩු යටතේ පැවති අත්තනෝමතික රාජ්‍ය ප්‍රතික්ෂේප කිරිම මෙම න්‍යායික ගොඩනැගීමට ප්‍රධාන හේතුව විය. එසේ නම් ගම්‍යමාන වන තේරුම්ගැනීමක් වන්නේ සම්භාව්‍ය ලිබරල්වාදි මතවාදය එකල වු සමාජ සන්දර්භිය පසුබිම මත ඊට ප්‍රතිචාර ලෙස ගොඩනැගෙමින් ඉදිරියට ආ න්‍යායික ධර්මයක් වන බවය.

නූතන ප්‍රජාතන්ත්‍රවාදි න්‍යායේ වර්ධනයට ඇවැසි අත්තිවාරම් සාධක ගොඩනැගුණේද මෙම සම්භාව්‍ය ලිබරල්වාදි න්‍යායික ධාරාවන් හරහාය. ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ න්‍යායේ නැගීම තුළ සිවිල් සමාජය පිළිබඳ සංකල්පයද 19 වන සියවසේ වර්ධනය වුයේ රාජ්‍යයේ හිතුවක්කාර හා ප්‍රජාපිඩක චර්යා පුරවැසියන් ආරක්ෂා කිරිමේ විකල්පයක් හැටියටය. (උයන්ගොඩ, 2010) ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සාකච්ඡාවේදී සිවිල් සමාජය පිළිබඳ අදහස් මතුවන්නේ රාජ්‍යයේ සෘජු පාලනයෙන් හා මැදිහත්විමෙන් නිදහස්ව සංවිධානය වු පුරවැසි ක්‍රියාකාරිත්වය සහිත ක්ෂේත්‍රයන් ලෙසය. ඒ අනුව "සිවිල් සමාජයේ

නිදහස" යන තේමාවේදී ද ඊට ශක්තිමත් න්‍යායික පදනමක් සැපයූ මතවාදයක් ලෙස සම්භාව්‍ය ලිබරල්වාදය දැක්විය හැකි වේ.

ආණ්ඩුවක පැවැත්මට සුජාතභාවයක් (Legitimacy) පැවතිය යුතු අතර ලොක් එයට මූලාශ්‍ර ලෙස දකින්නේ මහජනතාවගේ කැමැත්තයි. සීමිත කාර්යයන් කිහිපයකට එනම් ජීවිතය නිදහස හා පුද්ගලික දේපොලවල ආරක්ෂාව සහතික කිරීමේ යනාදි කාර්යයන් ඉටු කිරීමේ දී එය ස්වාභාවික නීතියේ සීමාව ඇතුලත සිදු කිරීමට ආණ්ඩුවට ඇති නිශ්චිත බලයයි. එහිදී රාජ්‍ය බලයට සහ නීතියට ජනතාව අවනත වන අතර පාලකයන් කොන්දේසිය කඩන විට ඊට එරෙහිව නැගී සිටීමටද මහජනතාවට අයිතියක් ඇති බව ලොක් පෙන්වා දෙයි.

## සම්භාව්‍ය ලිබරල්වාදය හා ඇලෙක්සිස් ද තොක්විල්

ප්‍රංශ දේශපාලන චින්තකයෙකු වූ (1805 - 1859) තොක්විල් ද සම්භාව්‍ය ලිබරල්වාදී න්‍යායට මූලික න්‍යායික එකතු කිරීම් සිදුකල ප්‍රධාන ගණයේ චින්තකයෙකි. ඔහු විසින් 1835 - 1840 කාලය තුළ දී පළකළ Democracy in America කෘතිය තුලින් ඒ හා සම්බන්ධ විග්‍රහයන් ඉදිරිපත් කරයි. ඔහුගේ න්‍යායික විග්‍රහයන් තුළ ප්‍රධාන හඳුනාගැනීම් ද්විත්වයක් පෙන්වාදෙයි.

01) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක පවා පුද්ගල නිදහස උල්ලංඝණය වන්නේද? එසේනම් එයට ප්‍රතිකර්ම ලෙස ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය කැපවිය යුතුය.

02) රාජ්‍යයෙන් ස්වාධීනව පුරවැසියන් සංවිධානගතවීමේ සමාජ දේශපාලන අවකාශය ප්‍රජාතන්ත්‍රවාදයේ න්‍යාය සමඟ බද්ධ කිරීම. (Tocqueville, 1835 – 1840 )

සම්භාව්‍ය ලිබරල්වාදීන් පිලිගෙන තිබුනේද උපරිම නිදහස වෙනුවෙන් වූ පෞද්ගලිකවාදි අදහසකි. තොක්විල් ප්‍රජාතන්ත්‍රවාදය යනු බහුතර කැමැත්ත ලෙස පිලිගැනීමට අකමැති වූ අතර බහුතර පාලනය තුල පවතින නීර් - ප්‍රජාතන්ත්‍රවාදි ඵලවිපාක පෙන්වා දුන්හ. යුරෝපයේ සහ ඇමෙරිකාවේ සමාජ දේශපාලන අරගලවල ප්‍රධාන කාරණා දෙකක් පැවතුන බව තොක්විල් දක්වයි. එනම්,

- නිදහස
- සමානත්වය

තොක්විල් පවසන්නේ ප්‍රජාතන්ත්‍රවාදය හරහා නිදහස සම්පූර්ණ නොවූ බවයි. එයට හේතුව බහුතරයට සුළුතරය නිහඬකිරීමට ඇති බලයයි. එහිදී බහුතරයේ මතයට එකඟවීම හැර වෙන විකල්පයක් සුළුතරයට නොමැත . එය තොක්විල් හඳුන්වන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සර්ව බලධාරී පාලනය (Democratic Despotism) ලෙසයි. එනම් ඔහු සර්වබලධාරී මර්දනකාරි බලයක් කිසිසේත් අනුමත නොකර අතරම එම බලය සැබවින්ම ප්‍රජාපීඩක බලයක් ලෙස හඳුන්වයි.

තොක්විල් ගොඩනගන දෙවැනි තර්කය නම් පුරවැසියාට රාජ්‍යයෙන් ස්වාධීනව සංවිධානය වීමට ඇති අවකාශයයි. එහිදි ඔහු ඇමෙරිකානු දේශපාලනයෙන් උදාහරණ ගනු ලබන අතර, පුද්ගලයන් සමිති සමාගම් පිහිටුවාගනිමින් සංගමයක් බවට ඒකරාශිවී සාමුහික ශක්තිය මත අරමුණු ඉටුකරගන්නා අයුරු දක්වයි. එනම් 19 වන සියවසේ ඇමෙරිකානු සමාජයේ නිදහස පුරවැසි ස්වායකතතාව පැවත ඇතිබවයි.සම්භාව්‍ය ලිබරල්වාදය අගය කරන්නේ එලෙස පුද්ගල ස්වාධිනත්වය බලගැන්වුණු නිදහස් සමාජ අවකාශයකි. තොක්විල් පෙන්වා දුන්නේද සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයක් තුලින් බහුතරයේ ආධිපත්‍යයෙන් මිදි රාජ්‍යයෙන් ස්වාධිනව කටයුතු කිරිමට හැකිවිම තුළින් පමණක් පුද්ගල අභිලාෂ ඉටුකරගතහැකි බවයි.

## සම්භාව්‍ය ලිබරල්වාදය හා ජෝන් ස්ටුවර්ට් මිල්

සම්භාව්‍යය ලිබරල්වාදි න්‍යාය තවදුරටත් වර්ධනය කල දේශපාලන චිත්තකයෙකු ලෙස ජෝන් ස්ටුවර්ට් මිල් (1806 - 1873) හඳුනාගත හැක. ඔහු 1859 දී පළකල On liberty (නිදහස ගැන) කෘතියෙන් මේ පිළිබඳ විශ්ලේෂණාත්මක අර්ථදැක්විම් සිදුකර ඇත. ඔහු පෙන්වාදෙන්නේ රාජ්‍යයේ ස්වභාවය, අත්තනෝමතික රාජාණ්ඩුවේ සිට මහජන පාලනය කරා මාරුවිම තුල 'නිදහස' ට සිදුවුයේ කුමක්ද යන්න පිළිබඳවයි. නිදහස යන්නෙන් සම්භාව්‍ය ලිබරල්වාදින් අදහස් කළේ 'ජීවිතය හා පුද්ගලික දේපළ හිමිකරගැනීම සඳහා අන් බාහිර කෙනෙකු හෝ ආයතනයක හෝ හිතුවක්කාර මැදිහත්විමකින් තොරව පුද්ගලයන් සතු නිසර්ග අයිතියයි.' (උයන්ගොඩ, 2011)

නිදහස හා අධිකාරි බලය (Liberty and authority) පිළිබඳ ගැටළුව තුළ ඔහු දකින්නේ සමාජය තුළම පවතින බහුතරයේ ප්‍රජාපීඩනය වෙතින් පුද්ගල නිදහස උල්ලංඝණය වන බවයි. එය මිල් හඳුන්වන්නේ සමාජමය ප්‍රජාපීඩන තන්ත්‍රය (Social Tyranny) ලෙසය. සම්භාව්‍ය ලිබරල්වාදි චින්තනය තුළ බලය ඒකරාශීවිමක් කෙසේවත් බලාපොරොත්තු නොවේ. රාජ්‍ය සතු බලය විකේන්ද්‍රණය වු තරමට පුද්ගල සුරක්ෂිතතාව, නිදහස තහවුරු වනබව පිලිගනී. බලය ඒකරාශී වන තරමට එමගින් පුද්ගලයාට අත්වන පීඩනය සුළුපටු නොවේ. එම පීඩනය දෘශ්‍යමානව මෙන්ම අදෘශ්‍යමාන ආකාරයන්ගෙන්ද පිළිඹිබු වියහැකි බව එකී පිළිගැනීමයි. රාජ්‍යයට බලයක් අවශ්‍යය වන්නේ පුරවැසියන් අතර සිදුවන එකිනෙකාට හානිකිරිම් වැළැක්විමටය. නමුත් පුරවැසියන් තම පෞද්ගලික ක්ෂේත්‍රය තුළ සිදුකරන කිසිදු කටයුත්තක් පාලනය කිරීමට හෝ මර්දනයට ආණ්ඩුවට හෝ රාජ්‍යයට බලයක් නොමැත.පුද්ගලයා එකිනෙකාට සිදුකරන හානි වැළැක්විමට රාජ්‍යය මැදිහත්විය යුතුය. ඒ නිසාම සම්භාව්‍ය ලිබරල්වාදය රාජ්‍ය පොලිස් භටයෙකුගේ කාර්යභාර්යට සමාන කරයි. පොලිස් භටයා සමාජයේ සාමකාමි බව රකිමින් සියළු දෙනාට නිදහස සහ අයිතින් භුක්තිවිදිමට අවශ්‍යය අවකාශය

නිර්මාණය කරයි. එසේ සාධාරණ සමාජ අවකාශයක් නිර්මාණය කරනවා පමණක් නොව එම සාමකාමී සමාජ අවකාශයට තර්ජනයක් වන බාධාවන් වන තත්වයන් ඉවත් කිරිමට ද බැඳී සිටී.

18 වන සහ 19 වන සියවසේ වනවිට යුරෝපයේ දේශපාලන බලය රදළ වංශාධිපතින් සහ ප්‍රභූතන්ත්‍රයන්ගේ අතේ සිට සාමාන්‍ය මහජනයා අතට මාරුවෙමින් තිබුණි. ඒත් සමඟ සිදුවූ දේශපාලන අරගලවලදී සිවිල් අයිතිවාසිකම් පිළිබඳ අදහස මතුවී තිබුණි. එනම් පුද්ගල නිදහස තහවුරු කලහැක්කේ දේශපාලන අයිතිවාසිකම් වලින් පමණක්ම නොව සිවිල් අයිතිවාසිකම්ද අත්‍යවශ්‍යයම බව අවධාරණය විය. මූලිකවශයෙන්ම සිවිල් අයිතිවාසිකම් හරහා පුරවැසි ස්වායත්තතාව (Individual autonomy) ආරක්ෂාවන බව එහි කේන්ද්‍රිය හරය විය. ජෝන් ස්ටුවර්ට් මිල් පෙනීසිටියේදී එම මූලධර්මය තහවුරුකිරීමටය.

නූතන ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ පදනම් සැකසී ඇත්තේ සම්භාව්‍ය ලිබරල්වාදී න්‍යායික පරිකල්පනයන් මතය. එහිලා මහජනතාවට වගකියන නියෝජන ආණ්ඩුක්‍රමය පිළිබඳ සිද්ධාන්තය අතිමූලික වේ. ආණ්ඩුවක් බලයට පත්වීම යනු ඡන්දදායකයා හා රාජ්‍යය අතර සිදුවන තාවකාලික බැඳීමක් හා නිත්‍යානුකූල ගිවිසුමක් වන නිසාම ආණ්ඩුව මහජනතාවට වගකීමට සහ පිලිතුරු දිමට බැඳී සිටී. පුද්ගල නිදහස තහවුරු වන්නේද මෙවන් ආණ්ඩුක්‍රමයක් තුලදී බව මිල්ගේද පිලිගැනීමයි.

ජෝන් ස්ටුවර්ට් මිල් මෙවන් ලිබරල්වාදි න්‍යායික මූලධර්ම හඳුන්වා දුන්නේද යම් පදනමක් මත පිහිටාය. එම පදනම කුමක්ද ? එම පදනම නම් සීමිතකරණයි. නිශ්චිත සීමාවක් මත පදනම් වූ බලයයි. එනම් අවම රාජ්‍යයයි. සියල්ල තීරණය වන්නේ අවම රාජ්‍ය (Minimum state) මතය. එනම් මැදිහත්කරණයෙන් තොරවූ දූරස්ථ රාජ්‍යය ක්‍රමයයි.

## <u>සම්භාව්‍ය ලිබරල්වාදී න්‍යාය සහ චාල්ස් මොන්ටෙස්ක්‍යු</u>

සම්භාව්‍ය ලිබරල්වාදී දේශපාලන දර්ශනයේ ඇති මූලිකම ප්‍රවාදයක් වන්නේ පුද්ගල නිදහසට රාජ්‍යය බලයෙන් එල්ලවිය හැකි බලපෑමයි. 18 වන ශතවර්ෂය වන විට යුරෝපීය අත්තනෝමතික රාජාණ්ඩු ක්‍රමයන් තුළ ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන ත්‍රිවිධ බලතල ඒකරාශීවීම තුල ඇති වූ භයානක ඵලවිපාක සඳහාද හේතුවුයේ මෙම බල සංකේන්ද්‍රණයයි. මොන්ටෙස්ක්‍යු ද පුද්ගල නිදහස තර්ජනයට ලක්වන ප්‍රධාන මූලාශ්‍රය ලෙස දුටුවේ රාජ්‍ය බලයයි. ඔහු විසින් 1748 දී පළකරන ලද The spirit of laws (නීතියේ ජීවගුණය) කෘතිය මේ හා සම්බන්ධ න්‍යායාත්මක විග්‍රහය සිදුකොට ඇත. එහිදී ඔහුගේ නිරික්ෂණයට ලක්වුයේ බ්‍රිතාන්‍ය දේශපාලන සන්දර්භයයි. ඔහු පෙන්වාදෙන ආකාරයට බ්‍රිතාන්‍යයේ රාජාණ්ඩුවාදය, රඳළවාදය හා ප්‍රජාතන්ත්‍රවාදය ගැබ්ව තිබුනේ ස්ථාන ත්‍රිත්වයකටය. රාජාණ්ඩුව විධායකයෙන් රදළවාදය ව්‍යවස්ථාදායකයේ හා අධිකරණය සාම් මන්ත්‍රි මණ්ඩලයේත්, ප්‍රජාතන්ත්‍රවාදය මහජන මන්ත්‍රි මණ්ඩලයේත් ලෙස විකේන්ද්‍රණය වි තිබුණි. ඒතුළ පුද්ගල නිදහස සුරක්ෂිතවීම දැකිය හැකිවු අතර එය මොන්ටෙස්ක්‍යුගේ බලතල බෙදිමේ න්‍යාය ගොඩනැගිමට ප්‍රධාන ආධාරක පසුබිම විය. වැඩි බලයක් ඒකරාශිවීම තුල හැම විටම සිදුවන්නේ බලයෙන් අයුතු ප්‍රයෝජන

ගැනීමයි. නමුත් බලතල ත්‍රිවිධ ආයතන වෙතට සමබර කෙරුවිට බලයෙන් බලය දමනය කිරීමක් කලහැකි වේ. එය ඔහුගේ වචනාර්ථයෙන්ම මෙසේය.

" නීති පැනවීම, නීති ක්‍රියාත්මක කිරීම හා නීති විනිශ්චය කිරීම එකම මිනිසෙකු හෝ මණ්ඩලයක අතට, ඔවුන් වංශාධිපතියන් හෝ සාමාන්‍ය මිනිසුන් වුවත්, ඒකරාශී වන්නේ නම් ඒ වු කළී සෑම දෙයකම අවසානයයි. (Enotes.com)

රාජ්‍යයේ ආයතනික බලව්‍යුහයන් එසේ සංවරනයකට ලක්කිරීම තුළ පමණක්ම පුද්ගල නිදහස ආරක්ෂා කලහැකි බව පෙන්වා දෙයි. ඒ නිසාම ඇමෙරිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්මාණය එම බලතල බෙදීමේ මුලධර්මය මත පදනම්ව ගොඩනැගුහ. මේ අනුව චාල්ස් මොන්ටෙස්කියුගේ බලතල බෙදීම සම්බන්ධ න්‍යායාත්මක ගොඩනැගීම් සම්භාව්‍ය ලිබරල්වාදි චින්තනය පෝෂණය කිරිමෙහිලා අනිවාර්ය බලපෑමක් සිදුකරන ලද බව පැහැදිලිය.

සම්භාව්‍ය ලිබරල්වාද න්‍යායට අදාළව රාජ්‍ය පිලිබඳ සුවිශේෂි දෘෂ්ටි කෝණයකින් බැලු තවත් ප්‍රධාන ගණයේ චින්තකයෙකු වන්නේ තෝමස් පේන්ය. (Thomas Paine) ඔහු රාජ්‍ය දකින්නේ අනිවාර්ය අනර්ථයක් (State is a necessary evil) ලෙසය. (Das, 2015)

රාජ්‍යයෙහි වැදගත්කම ප්‍රතික්ෂේප කල නොහැක. (Undeniable) නමුත් එහි පවතින අනර්ථකාරි ස්වරූපය සමනය කලයුතු බව පේන් පෙන්වා දෙයි. රාජ්‍යයට පවරා දිය යුත්තේ පුද්ගල සංවර්ධනය සඳහා වු අවම කාර්යයන් (Minimum Functions) ප්‍රමාණයකි. ඉන් ඔබ්බට රාජ්‍යයට කිසිදු කාර්යය කොටසක් හිමිනොවන බව පේන්ගේ දැඩි අවධාරණයි.

සම්භාව්‍ය ලිබරල්වාදී න්‍යාය තුල පවතින ප්‍රධාන න්‍යාය ධර්මයක් වන්නේ ස්වභාවික අයිතිය පිළිබඳ න්‍යාය (Theory of natural rights) ය. සම්භාව්‍ය ලිබරල්වාදය විශ්වාස කරන්නේ මෙම ස්වභාවික අයිතින් අන්සතු කිරිමට හෝ අහිමි කිරිමට නොහැකි බවයි. මෙම ස්වභාවික අයිතින් පිළිබඳ න්‍යායගතකරණයේ ප්‍රධාන න්‍යායවේදින් දෙදෙනෙකු සිටි. එනම්,

ජෝන් ලොක් ( John Locke)

තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson) ය.

ජෝන් ලොක්ගේ විග්‍රහය ඉහත දී සාකච්ඡා කල අතර ඔහු එංගලන්ත විප්ලවයට හා අයිතිවාසිකම් පනතට (Bill of Right) පනතට ප්‍රබල දායකත්වයක් සැපයුවෙකි. ස්වාභාවික අයිතින් වලට එරෙහි ඕනෑම ආකාරයේ ප්‍රචණ්ඩත්වයක් පුරවැසියාගේ බිඳවැටීමට හේතුවන බව ඔහු පෙන්වා දෙයි. ජෙෆර්සන් (1743 - 1826) මෙම ස්වාභාවික අයිතීන් ඉතා ඉහලින් අගය කල අතර ඔහු වරක් පවසා ඇත්තේ අඩුවෙන්ම පාලනය කරන රාජ්‍ය හොඳම රාජ්‍යය බවයි. " That Government is best which governs least" (Das, 2015)

ඔහුට අනුව අවම පාලනය යනු වැඩියෙන්ම අයිතින් ස්ථාපිත කල තත්වයකි. (The minimum goverínce mean the maximum realization of natural rights) මින් පැහැදිලි වන්නේ සම්භාව්‍ය ලිබරල්වාදි චින්තනය තුල ස්වාභාවික අයිතින් පිළිබඳ අදහස අතිමූලික කාරණයක් සේම නොවැළැක්විය හැකි තේමාවක්ව ඇති බවයි.

ලිබරල්වාදයට අවශ්‍ය දේශපාලන මතවාදි ප්‍රවාදය ඉහත දී සාකච්ඡා කල පරිදි ජෝන් ලොක් වැනි දේශපාලන දාර්ශනිකයන් විසින් ගොඩනගන විට සම්භාව්‍ය ලිබරල්වාදයේ ආර්ථික ප්‍රවාදය ගොඩනැගූ ප්‍රධානතම මතධාරියා වනුයේ ඇඩම් ස්මිත්ය. 1776 දී ඇඩම් ස්මිත් (Adam Smith) විසින් රචනා කළ An inquiry into the nature and cause of the wealth of nations - ජාතීන්ගේ ධනය) කෙටි නමින් සුප්‍රකට වූ කෘතිය තුළ තනි පුද්ගලයින් හට නිදහසේ තරගකිරිමට සම අයිතිය සහ නිදහස ලැබිය යුතු බවට වූ අදහස ඉදිරිපත් කරන ලදී. ස්මිත් පෙන්වා දෙන පරිදි නිෂ්පාදනය කළ යුත්තේ කුමන භාණ්ඩ ද? එම භාණ්ඩ කුමන ප්‍රමාණයකින් නිෂ්පාදනය කලයුතු ද? කා සඳහා නිෂ්පාදනය කලයුතු ද? යන ගැටළු විසදෙන්නේ කිසිදු සැළසුමකින් තොරව බවත් එක් එක් පුද්ගලයා ආත්ම ලාභය ප්‍රමුඛ කොටගෙන ක්‍රියාත්මක වන අතර මහජන සුභසිද්ධිය පුද්ගලයාගේ ආත්මාර්ථකාමිත්වය යැයි හඳුනාගනී. මේ අනුව ඇඩම් ස්මිත් පෙන්වා දී තිබෙන්නේ ධනපති ක්‍රමය හැසිරවීම සඳහා දේශපාලන හස්තයක් අවශ්‍යනොවන බවයි. ඔහුට අනුව ධනේෂ්වර ක්‍රමය හැසිරවීම සඳහා අදෘශ්‍යමාන බලවේගයක් වශයෙන් මිල යාන්ත්‍රණය පවතී.

ඇඩ්ම් ස්මිත්ගේ සමකාලිනයෙකු හෝ ඇඩම් ෆර්ගයුෂන් Adam Ferguson (1723 – 1816) ද සම්භාව්‍ය ලිබරල්වාදි චින්තනයේ තවත් පැතිකඩක් විග්‍රහ කරයි. ඔහුට අනුව මිනිසුන්ගේ ස්වයං සතුට වඩාත් විවිධත්වයෙන් යුතු ලෝකයක් ගොඩනගා ගැනීමට හේතු වේ එනම් ස්වයං පෝෂණය ශක්තිමත්වීම පොදු සමාජ ප්‍රගමනයට සෘජුව හේතුවේ. පුද්ගලාර්ථය වෙනුවෙන් මෙම මතවාදී අදහස් බලපා ඇත. මිට අමතරව ප්‍රංශ දේශපාලන න්‍යාය වේදියෙකු වූ Frederic Bastiat (1801 – 50) පෙන්වා දෙන්නේ තනි පුද්ගල නිදහස හා නිදහස් වෙළඳපල පාලනය නොකරන ලද වෙළඳ පල යාන්ත්‍රණයක් තුළින් තහවුරු වන බවයි. එහිදී රාජ්‍යය විශ්වාස කල නොහැකි (Unrelable) ආයතනයක් සේ හඳුන්වාදෙන ලදී. මීට අමතරව Richard Cobden (1804 – 1865), Herbert Spencer (1820-1903), Friendrich A, Hayek (1899-1992), Ayn Rand (1905-82) Isaian Berlin (1909-1997) වැන්නන් සම්භාව්‍යය ලිබර්වාදයේ දාර්ශනික කතිකාව ශක්තිමත් කල ප්‍රමුඛයෝ වෙති.

මේ ආකාරයට න්‍යායික ගොඩනැගීම් සම්භාව්‍ය ලිබරල්වාදයේ සිදු වූ අතර 20 වන ශතවර්ෂය වන විට කොමියුනිස්වාදය ජාතික සමාජවාදය මිලිටරිකරණය යන ඒවා මධ්‍යගත මතවාදයක් බවට පත්විය. විශේෂයෙන්ම ජාතික රාජ්‍යයන්ගේ නැගීම සමඟ සියලු ප්‍රජාවන් ඒකාග්‍රකරණය රාජ්‍යයට පැවරුණු පුළුල් කාර්යභාරයක් වන අතර රාජ්‍ය බලය ශක්තිමත් වුනි. එම ශක්තිමත් වීම ව්‍යවස්ථාපිත රාමුවකින් හා සීමිත ආකාර වූ එකක් බවටත් එය වගකීම් සහගත බලයක් බවටත් තහවුරු විය. විවිධත්වය සඳහා වූ සම්භාව්‍ය ලිබරල්වාදි පිළිගැනීම වුයේම අභිමත හුවමාරුකරගැනිම් ( Voluntary

exchange) යන්නයි. මෙම පිලිගැනිම මතින් වු සමාජ හා ආර්ථික පර්යාය අභියෝගයට ලක්වුයේ ජාතියක් නැතහොත් රාජ්‍යයක් තුල ජිවත්වන සියලු දෙනා සමාන සමාජ ආරක්ෂණයෙන් හා සමාන අවස්ථාවන්ට හිමිකම් කිවයුතුය යන පිලිගැනිම හා ඒ සඳහා සියලුදෙනාට අයිතියක් ඇත යන නීතිමය පිලිගැනීම් ජාත්‍යන්තරකරණයවීමත් සමඟයි. නමුත් රාජ්‍යයන් සිය ජාතික පාලන මුලෝපායන් තුල විවිධ උපායමාර්ගික මතවාදයන් අදාළ කොටගෙන තිබේ. උදාහරණයක් ලෙස චිනයෙහි පුළුල් දේශපාලන හා සමාජ නිදහසත් රාජ්‍ය විසින් පිරිනමා නොමැත. නමුත් ආර්ථිකමය වශයෙන් පුළුල් අවස්ථාවක් (Fair measure of economic freedom) පවතී.

වර්තමාන දේශපාලන ලෝකය ගත්විට ඒතුලද සම්පුර්ණයෙන්ම සම්භාව්‍ය ලිබරල්වාදි ලක්ෂණ වියැකී ගොසින්ය යැයි කෙනෙකුට කිවනොහැක. විශේෂයෙන්ම ලෝකයේ අනෙකුත් ගතිකත්වයන්ට සාපේක්ෂව සීඝ්‍රයෙන් සිදුවන ආර්ථික ගෝලියකරණය හා නව ලෝක වෙනස්වීම් තුල අන්තර් පරායන්තතාවයෙන් යුතු සමාජ ගොඩනැගී ඇතිවාසේම ගෝලිය ලෙස ක්‍රියාත්මක පාත්‍රයන්ගේ පැමිණීම වර්ධනය වෙමින් ඇත. ඒ අනුව රාජ්‍යයේ භුමිකාව හා මතවාද නිර්මාණය වීම සිදුවේ.

ඉහත චින්තකයන් විශේෂයෙන් ජෝන් ලොක්, ජෝන් ස්ටුවර්ට්, මිල් හා ඇලෙක්සිස් ද තොක්විල් යන ප්‍රධාන චින්තකයන් ගොඩනගන ලද න්‍යායික ධාරාව තුළ සම්භාව්‍ය ලිබරල්වාදී දර්ශනයේ ප්‍රධාන ප්‍රස්තුතයන් ද්විත්වයක් හඳුනාගත හැක. එනම්,

i. පුද්ගල නිදහසට එල්ලවන තර්ජනයේ ප්‍රධාන මුලාශ්‍රය වන්නේ රාජ්‍යයයි.
ii. රාජ්‍යය දේශපාලන සමාජයට නැතුවම බැරි දෙයක් නිසා පුද්ගලික නිදහස සුරකෙන පරිදි රාජ්‍යයේ වරම, සංයුතිය හා බලතල සීමා කීරිමයි.

මේ තුලින් බලාපොරොත්තු වුයේ රාජ්‍යය අකර්මන්‍ය කිරීම නොවේ. රාජ්‍ය සම්පුර්ණයෙන් අනවශ්‍ය ආයතනයක්ය යන්න කිසිසේත් සම්භාව්‍ය ලිබරල්වාදය නොපිළිගනී. මෙහිදී සිදුව ඇත්තේ රාජ්‍යය සීමාසහිත ආයතනයක් බවට පත්කිරීමයි. නමුත් ප්‍රායෝගික භාවිතාව තුල රාජ්‍යයට සමාජ ක්‍රියාවලියට සම්බන්ධ නොවේ. මුරකරුවෙකුගේ භුමිකාව රඟදක්වමින් අවම කාර්ය කොටසක් අත්පත්කරගනිමින් සිටිමට නොහැකි තත්වයක් උද්ගත විය. එසේ උද්ගත වුයේ ඇයි ? සම්භාව්‍ය ලිබරල්වාදි චින්තනයට ඉන් ඔබ්බට ගොස් සමාජය හැසිරවිමේ වැඩ කොටසක් හිමිකර ගැනීමට සිදුවුයේ මන්ද ? එයට පසුබිම් වුයේ 19 වන සිවස වනවිට කාර්මික විප්ලවය සිදුවිමත් සමග ඉතා ප්‍රබල ලෙස සමාජ, ආර්ථික ක්ෂේත්‍රයන්හි පරිවර්තනීය තත්වයක් සිදුවිමයි. එම පරිවර්තනය සමාජයේ ඇති නැති පරතරය, දුගි බව, සමාජ විෂමතා, අපරාධ ආදි දුර්විෂමතා රාශියක පැනනැගීමට බලපාන ලදී. මෙම තත්වය සමථනය කොට සමාජය මෙහෙයවිම සඳහා ජෝන් ලොක් හා ජොන් ස්ටුවර්ට් මිල් රාජ්‍යයට හිමිකරදුන් මුරකරුවෙකුගේ භුමිකාව ප්‍රමාණවත් නොවිය එම නිසාම සමාජය යම් මෙහෙයවිමට ලක්කිරීමට රාජ්‍ය බල ක්ෂේත්‍රය පෙරට වඩා අවශ්‍යය තත්වයට පත්විය. මෙම කතිකාවේදී ලිබරල් දාර්ශනිකයෙකු වු ජෙරමි බෙන්තම් විසින් ගොඩනගන ලද න්‍යායාත්මක විග්‍රහය අදාළ වේ. 1789 දී

බෙන්තම් පළ කල An Introduction to the principles of Morals and legislation (සදාචාරයේ සහ නීති සම්පාදනයේ මුලධර්ම ගැන හැදින්වීමක්) කෘතිය තුළින් උපයෝගිතාවාදය (Utilitarianism) නමින් නව සංකල්පයක් හඳුන්වාදෙන ලදී. ඒතුලින් පෙන්වා දෙන මූලිකම හරය වන්නේ සෑම මනුෂ්‍ය ක්‍රියාවකම පදනමේ තිබෙන මුලධර්මය වේදනාව හා සතුට බවයි. රාජ්‍යයේ අරමුණ විය යුත්තේ ද සමාජයේ සිටින වැඩිම දෙනාගේ වැඩිම සතුට (Greatest happiness of the greatest number) සඳහා ක්‍රියා කිරීමයි  බෙන්නම් මීට අදාළව ප්‍රධාන දේශපාලන නිගමන 2 ක් පෙන්වා දෙයි.

01) ආණ්ඩුවේ කාර්යය විය යුත්තේත් සහ රාජ්‍ය ප්‍රතිපත්තිවල අරමුණක් විය යුත්තේත් සමාජය සමන්විත වන උපරිම තෘප්තිය අපේක්ෂා කරන පුද්ගලයින් වැඩිම දෙනාගේ වැඩිම සතුටයි.

02) පාලකයන්ද පාලිතයන් මෙන්ම තම තෘප්තිය උපරිම කරගැනීමට ක්‍රියාකරන නිසා ඔවුන් තමන් සතු ආණ්ඩු බලයත් අයුතු ලෙස ප්‍රයෝජන ගැනීමට ඉඩඇති බැවින් එය වැලැක්වීම මහජනතාවට අවස්ථාවක් දිය යුතුය.

(Hold, 1998)

මේ අනුව පුරවැසියන් උපරිම ප්‍රමාණයක උපරිම තෘප්තිය සඳහා නිදහස් ඡන්දය හා නිදහස් වෙළඳපොළ අනිවාර්ය සාධක වේ. එනම් ප්‍රජාතන්ත්‍රිය ලෙස ජනතාවට වගකීමට හා උත්තරදීමට පාලන තන්ත්‍රයන් බැඳී සිටී. එම ආර්ථික නිදහස පිළිබඳ සංකල්පගතකරණයේදී බෙත්නම්ගේ තවත් රචනයක් වු Manual of Political Economy කෘතිය අතිශය වැදගත් වේ. එහිදි ඔහු රජය ආර්ථික කටයුතුවලින් දුරස්විය යුතු ප්‍රමාණය පෙන්වා දෙයි. අවම රාජ්‍ය පිළිබඳ අදහසේදී ඔහු පාර්ලිමේන්තු ස්වාධිපත්‍යයට වැදගත්කමක් හිමිකර දෙන අතර බහුතරයේ කැමැත්ත මත පදනම් වු ආණ්ඩුව හොඳම ආණ්ඩුව බවට පත්විමට නම් ආර්ථික මැදිහත්කරණයට නොගොස් පුද්ගල නිදහසට වෙළඳපොළ තුළ ප්‍රමුඛතාව ලබාදිය යුතුබවට අවධාරණය කරන ලදී. සම්භාව්‍ය ලිබරල්වාදියෙකු වු නිසාම පෞද්ගලිකත්වය කෙරෙහි වැඩි වටිනාකමක් ලබාදී බහුතරයේ උපරිම සැපත වෙනුවෙන් රාජ්‍ය පාලන කටයුතු සඳහා අවම දායකත්වයක් සැපයීම වඩාත් උචිත බව දැක්විය.

සම්භාව්‍ය ලිබරල්වාදය තුල දී ඉහතින් පෙන්වා දුන් පරිදි අවම දායකත්වය යන්න තුලින් මැදිහත්නොවිම යන්න කිසිසේත් අර්ථවත් නොවේ.  සමානාත්මතා සමාජයකට පදනම් වන සමාජ ප්‍රතිසංස්කරණ ඇති කිරීමට අදාළ නීති සම්පාදනය කරමින් යම් මැදිහත්මක් තිබිය යුතුය යන්න අදහස මේ තුළ තදින්ම ඇත.

wkqrdO f;kakfldaka

foaYmd,k úoHd wdpd¾h

## ලංකාවේ පූර්ව යටත් විජිත ව්‍යූහය යටත්විජිත දේශපාලන ආර්ථික ව්‍යූහය තුළ බොහෝ වෙනස්කම් කරමින් අනාගත රාජ්‍ය පැවැත්ම කෙරෙහි කරන ලද මුඛ්‍ය බලපෑම

පිළිවෙලින් පෘතුග්‍රීසින් (1506 - 1656) ලන්දේසින් (1656 - 1796) සහ බ්‍රිතාන්‍යයන් (1796 - 1948) විසින් ශ්‍රී ලංකාව යටත් කර ගෙන සිටීම තුළ 1948 වනතෙක් ශ්‍රී ලංකාව යටත් විජිත රාජ්‍යයක්ව පැවති බවට හඳුනාගත හැකග මෙකී කාල පරිච්ඡේදය තුළ අධිරාජ්‍යයන් විසින් මෙරටට හඳුන්වාදුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හරහා මූලිකව දේශපාලන ආර්ථික හා සාමාජිය වශයෙන් සිදුකරන ලද බලපෑම මෙන්ම ඒතුළින් මෙරටට සමාජයෙහි සිදු වූ විපරිවර්තනයන් මෙහිදී සාකච්ඡාවට ලක්වේග පෘතුග්‍රීසින් හා ලන්දේසින් විසින් ගෙනගිය පාලනය තුල සිදු වූ වෙනස්කම් වලට වඩා වැඩි ප්‍රවේගයකින් ඉංග්‍රීසින් විසින් ගෙනගිය පාලනය මෙරට සමාජයට බරපතල බලපෑමක් සිදු කල නිසාම ඒ පිළිබඳව වැඩි අවධානය යොමු වේ.

<u>**ආර්ථික ක්ෂේත්‍රයට සිදු කරන ලද බලපෑම**</u>

1833 කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හරහා මුදල් මත පදනම් වූ ආර්ථිකයක් ගොඩනැගීම සිදුවියග ඒ අනුව මෙරට පැවති වැඩවසම්වාදී ආර්ථික ක්‍රම ලිහිල් වූ අතර භාණ්ඩ හුවමාරුව මත පදනම් වූ ආර්ථිකයල මුදල් මත පදනම් වූ වෙළඳපල ආර්ථිකයක් බවට පත්වියග රාජ්‍ය වෙළඳ ඒකාධිකාරය අහෝසිකර රාජ්‍ය නිර්බාධවාදයට පදනම දැමීම තුළ ප්‍රාග්ධන ප්‍රවාහයන්ට තිබූ බාධක ඉවත්කර විදේශ ආයෝජන හා පෞද්ගලික අංශයේ සහභාගිත්වය ආරක්ෂණය කර නිදහස් ව්‍යවසාය ප්‍රතිපත්තිය ශක්තිමත් කළේයග

ආනයන අපනයන ආර්ථිකය බිහිවීම ද යටත්විජිත පාලනය විසින් සිදුකරන ලද පරිවර්තනීය බලපෑමකිග වැවිලි ද්‍රව්‍ය අපනයනය කරන හා යැපුම් ආර්ථික කේෂත්‍රය වශයෙන් ද්විත්ව ආර්ථිකයක් ස්ථාපිත වුයෙත් කෝල්බෲක් යෝජනා හේතුකොටගෙනයග වෙළඳාම දියුණු වුයෙන් නාගරිකරණය වේගවත් වූ අතර මෙරටට මාර්ග පද්ධතියක් ඒ තුළ ගොඩනැගුණිග එසේම බටහිර වෙළඳාම ද පුළුල් වූ හෙයින් වරායවලට වූ වැදගත්කම ඉහල ගියේයග ඒ අනුව 19 වන සියවසේ දී කොළඹ වරාය සංවර්ධනය කරන ලදීග කොළඹ වරාය ලෝකයේ විශාලම කෘතිම වරායවලින් එකක් බවට පත් කරන ලදීග

නෞකා ශුද්ධ කිරීමේ තටාකයක්ද ඉදි කරනු ලැබූහ 20 වන සියවසේ මුල් කාලයේ ප්‍රකාශ වුයේ කොළඹ වරාය එහි පැමිණෙන නෞකා සංඛ්‍යාව සහ ඒවායේ පැටවිය හැකි බඩු ප්‍රමාණය අතින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ 3 වන තැන ද ලෝකයේ 7 වන තැන ද ලබාගත් බවයිග

(Denham, 1912, 113)

1844-1850 කාලය තුළ අධිරාජ්‍ය ආණ්ඩුව මෙරට ඉඩම් අක්කර 105486 වැවිලිකරුවන්ට විකුණා තිබූ අතර එයින් අක්කර 44100 ක් ස්වදේශික ජනතාව විසින් මිල දී ගැනීම දේශීය ව්‍යවසායක පන්තියේ වර්ධනයට හේතු වියග (Abesinghe – 1978, 30). වැවිලි කර්මාන්තය තුල විවිධ කර්මාන්ත ගොඩනැගුණු අතර නුතන බැංකු ක්‍රමයට පදනම ද කෝල්බෲක් ප්‍රතිසංස්කරණ හරහා සිදුවියග ඒවගේම නිෂ්පාදන

ක්ෂේත්‍රය තුළල කම්කරු පන්ති දෙකක් ඇතිවිම සිදු වු අතර රාජකාරි ක්‍රමය අහෝසි කිරිම නිසා ශ්‍රම සාධකය සංචල වුයෙන් ශ්‍රමය මුදලට විකුණන කම්කරු පන්තියක් බිහි වේග ඒත් සමඟ වෘත්තිය සමිති ව්‍යාපාරය ශක්තිමත් විම ද සිදු වේ

ස්වදේශීය කෘෂි ආර්ථිකය බිඳවැටිම මේ කාලයේ සිදු වු අතර සාම්ප්‍රදායික වි ගොවිතැන අඩපණ වුවාසේම බ්‍රිතාන්‍යයන්ගෙන් මෙරට කර්මාන්ත සංවර්ධනයට අනුබලයක් නොවිම හේතුකොටගෙන යටත්විජිත පාලන කාලය තුළ තුලිත ආර්ථික සංවර්ධනයක් ඇති නොවියග 1938 වනතෙක් මෙරට කර්මාන්ත දෙපාර්තමේන්තුවක්වත් පිහිටුවා නොතිබුනිග එහෙත් වාරි කර්මාන්තය 1929 පසු පුළුල් කළේයග 1926 ඇති වු මහා පරිහානියක් සමඟ සිදු වු අවධමනය හේතුකොටගෙන පැනනැගුණු දුෂ්කරතා කියා නිර්බාධි සංකල්පයෙන් ඉවත්ව රාජ්‍ය සුභසාධක ප්‍රතිපත්තියට මාරුවිම සිදුවියග ඒ තුළින් යටත්විජිත පාලනය මෙරටට ඇති කළ බලපෑම වඩා පුළුල් තලයක විහිදේ

ව්‍යාපාර පිහිටුවිමට ආර්ථික දර්ශනයක් නොවු හෙයින් 1947-1948 කාළය තුල මුළු වියදමින් 36% ක් සමාජ සේවා කටයුතු සඳහා යොදවා ඇත. ( රත්නායක 2010,38) දේශීය අතරමැදියන් ලවා අතිරික්තය ලබා ගැනීම සඳහා යටත් විජිත පාලකයන් විසින් යොදා ගැනුනු ක්‍රමයක් වු ඡන්ද ක්‍රමය බ්‍රිතාන්‍ය පරිපාලකයන් විසින් ප්‍රසාරණය කළ අතර එය දේශීය ප්‍රාග්ධන සමුච්චයේ මුලික උල්පත වියග කෙසේ හෝ ලන්දේසි හා බ්‍රිතාන්‍ය කාල පරිච්ඡේදයේ සිදු වු අවසාන ආර්ථිකමය බලපෑම් සහගත කාරණය වුයේ සමාජ සන්දර්භය පුර්ණ වශයෙන් ධනේෂ්වර මුහුණුවරින් ස්ථාපිත විමයි

## සමාජීය වශයෙන් සිදු වු බලපෑම

සමාජීය වශයෙන් සිදු වු බලපෑම ප්‍රධාන වශයෙන් සමාජ ප්‍රභු පන්තියක් ගොඩනැගිම කෙරෙහි හේතු වියග කෝල්බෘක් ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන මෙරට පැවති වැඩවම් සමාජ ස්ථර ක්‍රමාණුකුලව බටහිර සමාජ ආකල්ප රැගත් ධනවාදි සමාජ සංස්ථාවක් බවට පරිවර්තනය විම ඇරඹුනිග ඒ අනුව සාම්ප්‍රදායික රදළ පන්තිය අභිබවා යුරෝපීය ධනපති පන්තියක් ද දේශීය මධ්‍යම පන්තියක්ද ඒ තුළින් උගත් මධ්‍යම පන්තියක් ද බිහිවියග

ඉංග්‍රීසි අධ්‍යාපනය හා අපනයන ආදායම වර්ධනය මෙරට සමාජ පන්ති ව්‍යුහය ගොඩනැගිමට බලපෑ ප්‍රධාන සාධක වේ පාලකයින්ට අවශ්‍යය දේශීය සහයෝගය ලබා ගැනීම අධ්‍යාපනය ප්‍රචලිත කිරිමේ ප්‍රධාන අරමුණ වුවද එමගින් මෙරට ස්වයං පාලනයක් සඳහා අවශ්‍ය පදනමක් දැමිමට සුදුසු අධ්‍යාපනයක් ඇති දේපළ හිමි ඉංග්‍රීසි උගත් ස්වදේශීය පන්තියක් බිහිවියග

1910 - 1914 කාලයේ සොලමන් ඩයස් බණ්ඩාරනායක තම පුතා වු එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායකට ඉගැන්විම සඳහා රෙඩ්පඩ් නැමැති කේම්බ්‍රිජ් උපාධිධාරියා යොදවා තිබුණිග

( Jayawardena - 1995)

එලෙස අත්දැකීම් ලත් ඉගෙනුම ලත් බොහෝ පිරිසක් පසුකාලිනව කිර්තිමත් දේශපාලනඥයක් බවට පත්වියග කෝල්බෘක් කොමිසම විසින් ප්‍රචලිත කරන ලද ඉංග්‍රීසී අධ්‍යාපනය හා අපනයන ආදායමේ වර්ධනය මෙරට සමාජ පන්තියක් ව්‍යුහයක් ගොඩනැගිමට බලපෑ සාධක වේ. ඉංග්‍රිසි

අධ්‍යාපනයට ඉහල මුල්‍ය වටිනාකමක් ලැබීම තුළ පන්තික පරතරය ප්‍රබලව ඉස්මතු වීම සිදුවිය. ඒත් සමගම මෙම ඉංග්‍රීසි උගත් මධ්‍යම පන්තිය යුරෝපීය ජීවන ක්‍රමයේ ආභාෂය ලැබුහ.

කුල මොඩලය අභියෝගයට ලක්කිරීම තුළ සියලුම කුලවල ජනයාට කුලවලට සීමා නොවූ රැකියාවලට අවස්ථාව හිමිවියග විවිධ වෘත්තිකයන්ගේ නැගීමත් සමඟ කුලය තවදුරටත් සමාජ ස්ථරායනය කිරීමේ පිළිගත් සමාජීය පොදු ක්‍රමයක් නොවියග විශේෂයෙන් ක්‍රිස්තියානි කරණය දිගින් දිගටම පවත්වාගෙන යාම සහ මෙරට ස්ථාපිත කිරිමට මිෂනාරි කටයුතු වල වටිනාකම තහවුරු කරත්ම ඊට විරුද්ධව පැන නැගී තිබු මෙරට ධනපති පන්තිය මූලික විය.

වෙළඳ ධනපති ක්‍රමය සංවර්ධනය වීම මගින් ජනවාර්ගික හා ආගමික ව්‍යාපාර සක්‍රීය කර වේගවත් කරනු ලැබින. (Jayawardena – 2014, 332) ගොවිගම කරාවල සලාගම ආදි නොයෙක් කුලයන් බෞද්ධාගමික ව්‍යාපාර සඳහා ප්‍රමුඛ මුල්‍ය දායකත්වය හා නායකත්වය ලබා දී ඇතග ඒ අතර ආර්ගජ්ග මිරැන්ඩෝල මතෙස් සල්ගාදුල අන්දිරිස් පෙරේරා ආදිහු වෙතිග නමුත් ඔවුන් සඳහා පූර්ණ අනාගත දේශපාලන සමාජ දැක්මක් නොවූ හෙයින් අනාගාරික ධර්මපාල ජාතික ආගමික ව්‍යාපාර ආරම්භ කරන ලදීග එය බ්‍රිතාන්‍ය පාලනයට බලපෑම් සහගත වුවාසේම මර්දනකාරි ප්‍රතිපත්තියක් එහි ලා අනුගමනය කොට ඇතග ඒ නිසාම අනාගාරික ධර්මපාල ඉන්දියාවේ සිට ලංකාවට පැමිණිම 1920 තෙක් බ්‍රිතාන්‍යයන් විසින් වළකා තිබුණිග මින් පැහැදිලි වන්නේ යටත් විජිත පාලනය තුළ ගොඩනැගුණු මෙරට ධනපති ක්‍රමය මගින් 19 වන සියවස වන විට ශ්‍රී ලංකාවේ ආගමික හා ජනවාර්ගික ජනජීවන වාදය ආරම්භ වූ බවයි.

විජිතමය ශ්‍රී ලංකාවේ ඇති වූ සමාජ සංස්කෘතික හා දේශපාලනික විපර්යාසය තුළ ස්ත්‍රිය සම්බන්ධව අපූර්ව පරිනාමික බලපෑමක් සිදුවන ලදීග මුල් කාලිනව පීතෘමූලික ව්‍යුහය තුළ ස්ත්‍රිය ස්ථානගත වී තිබුණ ද පසුකාලිනව ස්ත්‍රිය සම්බන්ධව වූ ධනාත්මක ප්‍රගමනයෙහි ලා යටත්විජිත බලපෑම ඉහල අගයක් ගනී. රක්ෂාවල යෙදිමේ අවස්ථාවල අධ්‍යාපනයෙහි අභිවර්ධනයල ව්‍යාපාරික කටයුතු වලට සම්බන්ධ විමග දේශපාලනිකමය ප්‍රවේශය සඳහා පදනම එහි මා මූලික වේ.

කලින් යුගවල දී ශ්‍රී ලංකාවේ උගත් හා නැණවත් බහුශ්‍රැත ස්ත්‍රීන් සිටි අතර විජිතවාදි පාලනය යටතේ එබදු කාන්තාවන්ගේ සංඛ්‍යාව තියුණු ලෙස වැඩිවිය.

( Jayawardena , 2014, 353)

යටත්විජිත සමයේ මුල්කාලිනව කුලය සහ පන්තිය අතර වූ සබඳතාව කවරාකාර මට්ටමක තහවුරු වුයේ ද? විශේෂයෙන් කුලය සහ ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වූ වෘත්තින් අතර තිබූ කේන්ද්‍රිය සබඳතාව තුළ කරාව සහ ගොවිගම කුලයක් අතර වූ තරඟය පැහැදිලියග අඩු පිළිගැනීමකින් යුතු කුල ජනතාව ආර්ථිකමය වශයෙන් ශක්තිමත් වීමත් සමාජ පිළිගැනීම සඳහා උනන්දුවත් පැවතුනිග ඒ වගේම විවාහය වැනි සබඳතා තුළින් කුල සබඳතා හුවමාරු වියග පවුල් සබඳතා පිළිබඳ ජාලයක් මගින් ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍යය අන්තර් සම්බන්ධතාව ඇති කරන ලදී ධනේෂ්වර ආරම්භය තුළ ආර්ථිකමය වශයෙන් පුළුල් ව්‍යාප්තියට එය හේතු වියග එසේ නම් මෙරට යටත් විජිත පාලනය

තුළ දේශපාලනික පරිසරය තුළ කුලයල පන්තිය අතිශය වැදගත් වූ ස්ථාවර තේමාවක් මුලයක් වූ බව පැහැදිලිය.

**<u>යටත් විජිත දේශපාලනික බලපෑම</u>**

යටත්විජිත පාලන ක්‍රමය තුල සිදු වූ දේශපාලන ප්‍රතිසංස්කරණ හරහා මෙරට සමාජ ක්‍රමයෙහි වූ පරිවර්තනය සහ එම බලපෑම නව දේශපාලන ප්‍රවනතා ඉස්මතු වීම කෙරෙහි යොමු වූ ආකාරය මෙහි දී සාකච්ඡා වේ.

කෝල්බෲක් ප්‍රතිසංස්කරණ තුළින් ඒකාබද්ධ රාජ්‍ය සංකල්පය ගොඩනැගීම සුවිශේෂි පාලන පරිවර්තනයක් වූ අතර ඒ අනුව මුල දී 16 ක් පාලක ප්‍රදේශ වියග 1835 වන විට මූලිකව පළාත් 5 කින් යුක්ත වූ අතර 20 වන සියවස වන විට මෙරට පලාත් 9 කට බෙදා වෙන් කරනු ලැබුහග ඒ පරිපාලන කටයුතු පහසුව උදෙසායග විශේෂයෙන්ම ලිබරල් පාලන ආකෘතිය තුළ ත්‍රිවිධ ආයතන ගොඩනැගිම මූලික ප්‍රජාතන්ත්‍රවාදි ලක්ෂණයක් වියග ව්‍යවස්ථානුකූල පාලනයක ප්‍රධාන ලක්ෂණයක් වන අධිකරණයේ ස්වාධිනත්වය හා අධිකරණයේ සමාන ඒකවරණ තහවුරු කිරිමට කැමරන් විසින් ඇති කරන ලද ප්‍රතිසංස්කරණ ඉවහල් විය.

එතෙක් මුහුදුබඩ හා උඩරට දෙවැදෑරුම් අධිකරණ ක්‍රමය වෙනුවට ශ්‍රේෂ්ඨාධිකරණය යටතට වූ තනි අධිකරණ ක්‍රමය මෙරට නීතියේ ආධිපත්‍ය පිළිබඳ සංකල්පය තහවුරු විමට සෘජුව දායක වුහ.

(Colin Thome , 1985, 87)

නියෝජන ආණ්ඩුක්‍රමය සඳහා පදනම වැටිම යටත් විජිත ආණ්ඩුක්‍රමය තුළින් වූ අතිමූලික කාරණයකිග කෲව් මැකලම් ප්‍රතිසංස්කරණ යටතේ වූ උගත්කම පදනම් කොටගෙන සිමිත ඡන්ද බලය ලබාදීම තුළ නියෝජන අවස්ථා පටු අවකාශයක පැවතුනිග නමුත් 1930 සර්ව ඡන්දබලය පුළුල් කිරිමේ ප්‍රතිඵලය ලෙස ප්‍රජාතාන්ත්‍රවාදී භාවිතය ව්‍යාප්ත කිරිමට හැකි වියග ජනවර්ගයල ආර්ථිකයල උගත්කමල කුලයල ආගම හෝ ස්ත්‍රී පුරුෂ කුමන හෝ අංගයක් නිර්ණායකයක් කොට නොගෙන ජනතාවට දේශපාලන පිටියට ප්‍රවේශවිමට අවශ්‍යය පරිසරය ගොඩනැගුනිග වාර්ගික නියෝජනය වෙනුවට ප්‍රාදේශීය නියෝජනය ද තහවුරු විම තුළ මහජනතාව හා නියෝජිතයා අතර අන්තර් සබඳතා ගොඩනැගුනිග ඒවා ප්‍රජාතාන්ත්‍රික දේශපාලන මූලිකාංගයන්ය.

සමාජය බොහෝ කාලයක් තිස්සේ විවිධ තට්ටු වශයෙන් නිශ්චිතව වෙන්කර තිබුණි. එමෙන්ම පහළ තට්ටුවේ සිට ඉහළ තට්ටුවට සංක්‍රමණය විම ඉතා අසීරු කරුණක් විය. තව ද වැඩි ජන සංඛ්‍යාවක් මැඩිමට හෝ ඔවුනට වඩා ඉහළ තත්වයක සිටිමට සුළුජන සංඛනවකට හෝ එක් පුද්ගලයෙකුට තිබුණා වූ අයිතිය ගැන ද කිසිදු ප්‍රශ්ණයක් නොනඟා තිබුණි. මේ සමාජ බෙදුමේ දැඩි අනම්‍යය බව ලිහිල් විමට ප්‍රජාතාන්ත්‍රික හා ඡන්ද දායක සංස්ථා අවශ්‍ය කරුණකි. සර්ව ජන ඡන්දබලය මේ සඳහා වැදගත් විය. ඒ වගේම සර්වජන ඡන්ද බලය මෙරට සාම්ප්‍රදායික වැඩවසම් ලක්ෂණවලට ප්‍රබල තර්ජනයක් විය. එමෙන්ම සර්වජන ඡන්ද බලය ලැබීම හේතුකොටගෙන බෞද්ධ පුනරුදය, සංස්කෘතික උරුමයන් ගොඩනැගීම හා ජාතිකානුරාගි ව්‍යාපාරවල යළි හිස එසවිමක්ද විය. මෙරට දේශපාලන හා ආර්ථික මතිමතාන්තර පිළිබඳ අළුත් නැඹුරුවක් වූ අතර දේශපාලනයට පිවිසි

කොටස්වලට ජාතික අවශ්‍යතාවයන් සඳහා නැඹුරුවීමට බලකිරිමක් ද විය. පහත උධෘතය එහි තවත් පැතිකඩක් පෙන්වයි.

සර්වජන ඡන්දබලය සමාජ සුභසාධනය සඳහා පුළුල් ප්‍රවණනතාවක් ජනිත කල අතර 1923 රාජ්‍ය සුභසාධනය සඳහා රජය වැය කල මුදලට වඩා සිව්ගුණයකින් පමණ ප්‍රමාණයකින් 1947 වන විට වර්ධනය විය. (ජයවර්ධන : 2011,20)

ශ්‍රී ලංකාවේ දනට පවතින පළාත් පාලනය බ්‍රිතාන්‍ය යුගයේ නිර්මිතයකි ආයතනික ගොඩනැංවීම් හා පළාත් පාලනය සම්බන්ධ වෙනස්කම් සිදුකිරිමෙහි දි කරන ලද බලපෑම ප්‍රබල තලයක පවතී. 19 වන සියවසේ ගොඩනගන ලද පළාත් පාලන ආයතන අතර මාර්ග කොමිටි මහ නගර සභාල ග්‍රාමිය ප්‍රජාව පිළිබඳ පනතල සනීපාරක්ෂක මණ්ඩල පළාත් මණ්ඩල ග්‍රාමිය දිස්ත්‍රික් සභා ආදි ආයතන අත්හදා බැලීම් මට්ටමේ ක්‍රියාත්මක වුවත් එමගින් විධිමත් පළාත් පාලන ව්‍යහයකට පුළුල් පදනමක් වැටිම වැදගත් විය. පසුව ගෙන ආ 1920 අංකඃ11 දරණ පළාත් පාලන ආඥාපන හා 1924 අංක 09 දරණ ගම්කාර්ය සභා ආඥා පනත වැදගත් ක්‍රියාමාර්ග ද්විත්වයක් විය.

1939 අංකඃ 61 දරණ පනත මගින් මහ නගර සභා පිහිට වු අතර 1946 අංකඃ 46 දරණ පනතින් එතෙක් ඒජන්තවරයා සතුව තිබු ගම්කාර්ය සභාවට වු අධික්ෂණ බලය පළාත් පාලන සහකාර කොමසාරිස්වරයාට පවරන ලදී. (ජයවර්ධන : 20011 50)

මේ අනුව 1948 ශ්‍රී ලංකාව නිදහස ලබන විට මහ නගර සභාල නගර සභා සුළු නගර සභා ගම්කාර්ය සභා ආදි වශයෙන් ප්‍රධාන පළාත් පාලන ආයතනික ව්‍යුහයක් ගොඩනැගි හමාරය. ඒ තුලින් පැහැදිලි වන්නේ යටත්විජිත පාලනය තුළ මෙරට පරිපාලනමය වශයෙන් සුවිශේෂි වෙනස්කම් රාශියක් සිදු වු බවයි.

මෙරට අනාගත ස්වාධීන ආණ්ඩුකරණය සඳහා අවශ්‍යය නායකයින් ගොඩනැගිම සඳහා ඩොනමෝර් යුගයේ වු බලපෑම ඉහලය. ඡන්දයෙන් පත් වු නායකයින්ට පරිපාලනයට තිබු අවස්ථා සහ රාජ්‍ය මන්ත්‍රණ සභාව හා විධායක කාරක සභා ද්විත්ව කාර්ය පාලනයකටල පුහුණුවකට අවස්ථාව ලැබුණි. නමුත් එහි ක්‍රියාකාරිත්වය සම්බන්ධව විවේචන පවතී. ජාතිවාදි හැගීම් සපුරා බැහැර කිරිමට ඩොනමෝර් ප්‍රතිසංස්කරණ ඉවහල් නොවුනද සාමුහික වගකිමෙන් යුත් කැබිනට් ක්‍රමයකට අවශ්‍ය මුලික ලක්‍ෂණ තහවුරු වු බව පිළිගත හැක. නමුත් යටත්විජිත පාලනය මෙරට දේශපාලන පක්ෂ ක්‍රමයක පැවැත්ම වෙනුවෙන් වු ප්‍රවේශයකට එළඹිමක් සිදු නොකිරිම මේ යුගයේ දක්නට ලැබුනි.

සිවිල් සේවය ලාංකියකරණය විම ස්වයං පාලනය ලබා ගැනිමේ මුලික පියවරක් විය,

1920 තෙක් ලංකා සිවිල් සේවාව බ්‍රිතාන්‍යය ඒකාධිකායක් වු අතර 1922 වන විට රාජ්‍ය සේවයේ ඉහළ ශ්‍රේණිවල සේවය කළ ලාංකිකයන් 39.5% ක් විය.

(බණ්ඩාරගේ , 2005,141)

ප්‍රජාතන්ත්‍රවාදි ආයතනික රාමුන් යම් යම් ආකාරයෙන් සකස් වුවද බොහෝ විට කීර්තිය හා ධනය රැස්කරගත් ආධිපත්‍යධාරි නායකත්ව පිරිසන් හි පැවැත්ම නොවෙනස්ව ඉදිරියට ආහ. පෙළපත්

උරුමයෙන් දේශපාලන පවුල් ගොඩනැගිම සිදු වුයේ යටත්විජිත පාලනයේ මුල් යුගයේ දි සියළුම පාලන මුලයන් කුලය. ධනය ආදිය ප්‍රවර්ධන කිරිම තුළ පවත්වාගෙන ඒම හරහාය. කෙසේ නමුත් ජනවාර්ගික වශයෙන් බෙදුනු හා කුලය මත පදනම් වු සමාජ පරිසරයට සර්ව ජන ඡන්ද බලය ලැබීම තුළ මෙරට බහුතර ජන වර්ගයේ හා බහුතර කුලයේ යන දෙකේම දේශපාලන බලය තහවුරු විම සිදුවිය.

යටත්විජිත පාලනය ශ්‍රී ලාංකේය සමාජ තුලට ඇති කළ බලපෑම න්‍යායාත්මක ප්‍රවේශයක් ආශ්‍රය කොටගෙන විමසිම තුළ යම් යම් වැදගත් වු නිගමනයන්ට එළඹිය හැකග විශේෂයෙන් යටත්විජිත ආර්ථික දේශපාලන හා සමාජ ව්‍යාප්තියේ දි පෙර පැවති සමාජ ව්‍යුහයන්ට කුමක් සිදුවුයේ ද ? යටත් විජිත සමාජවල වු වෙනස්කම්ල ගතිකත්වයන් කුමන ස්වරූපයක් ගත්තේ ද? යනාදි මතභේදාත්මක මාතෘකා විවිධ න්‍යායාත්මක සිද්ධාන්ත තුළ විග්‍රහ වේ.

ප්‍රමුඛ සමාජ විද්‍යා න්‍යායික ගුරුකුලයක් වන නවීකරණ ගුරුකුලය නැතහොත් සංවර්ධන ගුරුකුලය දරන්නා වු දෘෂ්ටිය මෙහි දි අදාළ කරගත හැක. ඔවුන් අදහස් කරන්නේ මේ රටවල බටහිර හා ගැටෙන විට දක්නට ලැබුණු දුප්පත්කම ආර්ථික පසුබටතාවය . දේශපාලනමය දරිද්‍රතාවය මේ සමාජවල පැවති අංග ලෙසය. දියුණුව සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය තාක්ෂණය ආකෘතින් හා සංවර්ධන රාමුන් ඔවුන් විසින් සපයන ලද බවට ඔවුහු තර්ක කරති. ඔවුන් බටහිර නොවන රටවල සංවර්ධනයට ඇති එකම බාධකය ඔවුන්ගේ සාම්ප්‍රදායික සමාජ ව්‍යුහයන් හා සාරධර්ම පද්ධතින් ලෙස දකිති. එය නවීකරණයට ඇති ප්‍රධාන බාධකය ලෙස දකි.

( Manning, 1963, 5)

මෙහි යම් එකඟතාවයන්ට එළඹිය හැකි තත්වයක් පවතී. යටත්විජිත කාලය තුළ ශ්‍රී ලංකාවේ ඇති කරන ලද දියුණු සන්නිවේදන ජාල. පාසල් පද්ධති හා පරිපාලන ව්‍යුහයක් විය. දූවැන්ත යටිතල පහසුකම් සංවර්ධනයක් විය. එහෙත් ජාතික ස්වයං පාලනයල සමාජ සාධාරණය ( පළාත්, සමාජ පන්තින්, ජාතික කණ්ඩායම්ල ස්ත්‍රී/පුරුෂ බෙදීම් හරහා ) දේශීයයන්ට බලතල පැවරිම ආදිය සළකා බැලුවහොත් එකි තර්කය අවඥාවට ලක් වේ. උදාහරණ ලෙස ලංකාව ලෝක වෙළඳපළට ඇතුළත් කරනු ලබන්නේ කෝපි හා හැම වර්ගයකම ආහාර අපනයනකරුවෙකු ලෙසය. ඒ තුළ මෙරට ස්වයං පෝෂිත බව නැසී ගියේය. වෙළඳපොළ සසලවීම් වලට මෙරට සංවේදි විය.

කෙසේ හෝ අවධාරනය කලහැකි වන්නේ යටත්විජිත බලපෑම විවිධාකාර ස්වරූපයන් ගන්නා විවිධ විචල්‍ය ක්‍රියාදාමයක් බවයිග මෙරට දේශපාලන සමාජ ආර්ථික සන්දර්භයන් හි සිදු කරන ලද පරිවර්තතීය ලක්ෂණ කෙටිකාලිනව හා දිගුකාලිනව බොහෝ සාධනිය මෙන්ම නිශේධනිය ප්‍රගමනයට හේතු වියග යැපිම්වාදයල යටත්විජිත රටාවල පර්යන්ත ධනවාදය ලෝක පද්ධති ආදි ආකෘති මෙම යටත්විජිතවාදය තේරුම් ගැනිමට රාමුන් සැපයුවද අභ්‍යන්තර සමාජ හැඩගැසීම් සුවිශේෂී වේ ලංකාවේ පුර්ව යටත් විජිත ව්‍යුහය යටත්විජිත දේශපාලන ආර්ථික ව්‍යුහය තුළ බොහෝ වෙනස්කම් කරමින් අනාගත රාජ්‍ය පැවැත්ම කෙරෙහි කරන ලද මුඛ්‍ය බලපෑම ඉහත ලෙස සංක්ෂිප්තව පෙළගැස් විය හැක

# ජොහාන් ගැල්ටුන්ගේ සංකල්ප යොදාගනිමින් ඕනෑම රාජ්‍යයක ගැටුමක් විශ්ලේෂණාත්මකව විග්‍රහ කරන්න.

ඕනෑම සංසිද්ධියක හෝ ප්‍රපංචයක තත්වාකාර හරයන් තේරුම්ගැනිම සඳහා යම් සංකල්පීයමය රාමුන් අවශ්‍යය වේ. න්‍යායාත්මක පදනමකින් තොර විග්‍රහයන් බොහෝ විට අර්ථසම්පන්නභාවයෙන් හින වේ ගැඹුරු මෙන්ම විවිධාකාර දෘෂ්ටිමය යථාර්තයන්ගෙන් යුක්තව යම් යම් සිද්ධින් විශ්ලේෂණය ඕනෑම අධ්‍යයන ක්ෂේත්‍රයක මුඛ්‍ය අරමුණ වේ. ගැටුම් පිළිබඳ අධ්‍යයනය තුළ ද එකී සත්‍යය එකහෙලාම අදාළ වේ. ගැටුම යන්න පිළිබඳව පොදු මෙන්ම නිශ්චිත නිර්වචනයක් නොමැතිවා සේම ගැටුම් අධ්‍යයනය පිළිබඳව පොදුවේ පිලිගත් ඒකීය සංකල්පයක් නොමැත. ගැටුමක් යනු කුමක් ද? එහි ස්වභාවය, ගැටුම් වර්ගීකරණය, ගැටුම් සඳහා බලපාන හේතු, ගැටුම් නිරාකරණ ක්‍රමවේද හා එහි විකාශනය ආදි තේමාවන් පිළිබඳව විවිධ චින්තකයන් විවිධ වූ දෘෂ්ටින්මත හිඳ විග්‍රහයන් සිදුකොට ඇත. මේ තුල මුලිකව පොදු පිළිගැනිමකට ලක්වන පුරෝගාමි පුද්ගලයෙකු ලෙස ජොහාන් ගැල්ටුන් (Johan Galtung) හඳුනාගත හැක. ගැටුම් අධ්‍යයනය සම්බන්ධ ගැල්ටුන්ගේ සංකල්පියමය මුලිකාංග ආශ්‍රයකොටගෙන ශ්‍රී ලාංකේය ජනවාර්ගික අර්බුදය විශ්ලේෂණය කිරිම මේතුළ සිදු වේ. එහි දී ප්‍රථමයෙන් ජොහාන් ගැල්ටුන් පිළිබඳ හඳුනාගැනීම අතිශයින් වැදගත් සේම ඵලදායි වේ.

## ජොහාන් ගැල්ටුන් හඳුනාගැනීම හා ගැටුම අර්ථකථනය කිරිම.

ජොහාන් ගැල්ටුන් 1930 දී නෝර්වේ ඔස්ලෝ හිදි උපත ලැබූ අතර සාම අධ්‍යයනය පිළිබඳ මහාචාර්යවරයෙකි. ගැටුම් හා සාම අධ්‍යයනයේ නිර්මාතෘවරයෙකු වන ගැල්ටුන් ගණිතඥයෙකි. සමාජ විද්‍යාඥයෙකි. දේශපාලන විද්‍යා විශේෂඥයෙකි. 1959 දී ඔහු ඔස්ලෝහිදි අන්තර්ජාතික සාම අධ්‍යයන ආයතනය ගොඩනැගු අතර එය ලෝකයේ සාම අධ්‍යයනය සඳහා වූ ප්‍රථම අධ්‍යයන පර්යේෂණ මධ්‍යස්ථානය විය. කොලොම්බියා, ඔස්ලෝ, බර්ලින්, බෙල්ග්‍රේඩ්, පැරිස්, ප්‍රින්ස්ටන්, හවායි ආදි ලොව පුරා විශ්ව විද්‍යාල රාශියක සාම අධ්‍යයනය පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙස ද ඔහු කටයුතු කොට ඇත. ගැටුම් ක්ෂේත්‍රය පිළිබඳ ඔහුගේ අධ්‍යයන තේමාවන් විවිධ දිශාවන් කෙරෙහි යොමු වූ අතර ඒ තුළ සාම ගොඩනැගිම සංකල්පගතකරණය, ගැටුම් මැදිහත්කරණය, සහජීවනය, තිර් ප්‍රචණ්ඩත්වය, ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය පිළිබඳ න්‍යාය, සාධනිය හා නිශේධනය සාමය, සාම අධ්‍යාපනය ආදි ප්‍රධාන ශීර්ෂ වේ. මේ ආකාරයෙන් හඳුනාගතහැකි මහාචාර්ය ගැල්ටුන් ගැටුම යන්න පිළිබඳව දක්වන නිර්වචනය ප්‍රථමයෙන් යම් ආකාර විග්‍රහයට ලක්කිරිම යෝග්‍ය වේ. ගැල්ටුන්ට අනුව ගැටුමක් යනු,

අනන්‍ය කරගතහැකි මානව කණ්ඩායම් සවිඥාණික ප්‍රතිපක්ෂ බවට පත්ව තම තමාට පොදුවේ අත්පත් කර ගත නොහැකි දේ අත්පත් කර ගැනිමට යාමේ දී ඇති වන තත්වයකි. (විතාරණ, චන්ද්‍රසේකර 2012)

ගැල්ටුන්ගේ මෙම නිර්වචනයට අනුව ගැටුම යන්න මිනිසා සම්බන්ධයෙන් පවතින්නක් බව දක්වා ඇත. මෙහි දී "සවිඥාණික ප්‍රතිපක්ෂ" යන්නෙන් අදහස් කරන්නේ දෙපාර්ශවයේම දැනුවත්භාවය

මත කණ්ඩායම් දෙකකට බෙදීම යන්නයි. එනම් තම පාර්ශවයට අදාල අනන්‍යතාවක් පවතින අතර ප්‍රතිපාර්ශවයට ද අනන්‍යතාවක් පවතිනවා යන්නයි. එය දෙපාර්ශවයම මනාව දන්නා අතර එම අනන්‍යතාවයට අදාළ කණ්ඩායම ද අනෙක් කණ්ඩායමෙන් වෙන්කර හඳුනාගත හැකි බව මෙහිලා කියැවේ.

පොදුවේ අත්පත් කරගත නොහැකි යන්නෙන් අදහස් කරන්නේ දෙපාර්ශවයටම එකවර අයිතිකරගත නොහැකි දෙයක් යන්නයි. එනම් විකල්පයක් රහිත එක් අරමුණක් ළඟාකර ගැනීම උදෙසා දෙපාර්ශවයක් උත්සාහකිරිමක් පිළිබඳව මින් කියැවේ. මේ සඳහා හොඳම උදාහරණයක් ලෙස තරඟයක් දැක්විය හැකිය තරඟයක දී අනන්‍ය වු කණ්ඩායම් දෙකක් පවතින අතර දෙපාර්ශවයම තරඟකරන්නේ ජයග්‍රහනය ලබා ගැනීමටය එහිදි ජය ගැනීම අරෙන්නට වෙනත් විකල්පයක් නැත එබැවින් ගැල්ටුන් පවසන්නේ එවන් අවස්ථාවක ගැටුමක් ඇතිවන බවයි. මේ අනුව ගැටුමක් වශයෙන් හඳුනා ගතහැකි වන්නේ තරඟකාරි අභිලාශයන්, විවිධ වු අනන්‍යතාවයන් හා ආකල්පිය වෙනස්කම් මත පුද්ගලයන් හෝ කණ්ඩායම් අතර ඇතිවන ප්‍රතිවිරෝධතාවයක් ලෙසයි. විවිධ වු අනන්‍යතාවයන් යන්නට පුද්ගලයන්ගේ වටිනාකම් ඇදහිලි හා විශ්වාසයන්, ජාතිකත්වය, ආගම, වර්ණය සහ කුලය වැනි සාධකයන් අදාළ වේ.

Oxford ශබ්දකෝෂයට අනුව ගැටුමක් යනු ,

පුද්ගලයින් කණ්ඩායම් හෝ රාජ්‍යයන් බරපතල නොඑකඟතාවයන්ට හෝ විවාදයන්ට සම්බන්ධ වි සිටින තත්වයකදී ගැටුම් පැනනගී. (Oxford Dictionery.com)

විවිධ ආශාවන් හා ඉල්ලිම් අත්පත්කර ගැනිමට සිදුකරනු ලබන විවාදය තුල ගැටුම ඇතිවන බව ඉහත නිර්වචනය තුළ අදහස් වේ. කෙසේ හෝ ප්‍රතිවාදින්ගේ අරමුණු අකර්මන්‍ය කරලිමට ඔවුන්ට හානි පැමිණවිමට නැතහොත් විනාශ කිරිමට උත්සහ කරමින් හිඟ තත්වයන් වන බලය හා සම්පත් පිළිබඳව වන ඉල්ලීම හා ආශාව හරහා අරගලය මතුවේ. එහිදී ප්‍රචණ්ඩත්වය මුදාහරිනවා වියහැක. එසේ නම් ගැටුම හුදු ශුද්‍ර තලය ඉක්මවා හෝ ජාතික හෝ අන්තර්ජාතික සීමාවන් අතික්‍රමණය කරමින් මතවාදීමය වශයෙන් හෝ ක්‍රියාත්මක වශයෙන් ව්‍යාප්ත විය හැක. මේ ආකාරයට ගැටුම යන සංකල්පය තේරුම් ගත හැකි වේ.

## ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයේ ස්වභාවය.

ශ්‍රී ලංකාව මුහුණදුන් ජාතිකත්ව ප්‍රශ්නය තරම් මතභේදයට තුඩුදුන් අනෙක් ප්‍රශ්නයක් නොමැති තරම්ය. තිස් වසරක් තිස්සේ ක්‍රියාත්මක වු යුද්ධය මෙරට දේශපාලන, ආර්ථික, සමාජ හා සංස්කෘතික ආදි ලෙස වු සෑම කේෂ්ත්‍රයකම කඩාවැටිමට දරුණු ප්‍රතිඵල අත්කර දුන් ඛේදාන්තයක් විය. විශේෂයෙන් දමිළ ජනතාවගේ අයිතිවාසිකම් ලබාදිම සම්බන්ධව ඒ ඒ කාලයන් තුළ ආණ්ඩු මෙහෙය වු පාලකයන් කලක් තිස්සේ සිටම පැහැරහැරිමක් ඔවුන් විසින් අනුගමනය කරනලද ප්‍රජාතන්ත්‍ර විරෝධි පාලන ක්‍රමයන් දමිළ ජනතාව ප්‍රජාතාන්ත්‍රවාදි ප්‍රවාහය කෙරෙහි තබා තිබු විශ්වාසයෙන් ඇත් කිරිමට

හේතුවිය. දික්ගැසුනු අවි ගැටුමක් වෙනුවෙන් විනාශකර ඇති මුදල් සම්භාරයන්, විනාශ කර ඇති මානව හා භෞතික සම්පත් ප්‍රමාණයන් පිළිබඳව සිතාබලන විට එය පහසුවෙන් ගොඩගත නොහැකි අන්දමේ ඇඳවැටිමකි.

ජනවාර්ගික ප්‍රශ්ණයට හේතු වු මුලයන් සොයා ඊට පිලියම් කල යුතුය යන මතය පසෙකලා සිංහල ජනතාව තුළ වර්ගවාදීමය අපේක්ෂා කුළු ගැන්වුවා මිස ශ්‍රී ලංකේය ජාතියක් ලෙස ප්‍රශ්නය විසඳා ගැනිමක් කෙරෙහි යොමු නොවුයේය. ශ්‍රී ලංකාවේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදි ජනවර්ගත් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා කතෝලික ලෙස වු ආගම්ද තුලින් පිළිඹිබු වන බහුවාර්ගික හා බහු සංස්කෘතිකමය ස්වභාවය තේරුම් ගැනිමට රාජ්‍ය අපොහොසත් විමතුළ අනොන්‍ය ජන කණ්ඩායම් එකිනෙකාගේ වෙනස්කම් අගයකරනවා හෝ ගරු කිරීම වෙනුවට ඒ කෙරෙහි සැකයෙන් බැලිමට පුරුදු විය. මේ සඳහා පුර්ව කොන්දේසි සිංහල දේශපාලන නායකයන් විසින් නොමඳව ගොඩනැගිම හරහා දේශපාලන තන්ත්‍රය කෙරෙහි නැතහොත් රාජ්‍ය කෙරෙහි ද්‍රවිඩ ජනතාවගේ විශ්වාසය හා බලාපොරොත්තු බිඳ වැටෙන්නට විය.

වෙනස්කොට සැලකිමේ ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය විම තුල මෙම අරගලය ක්‍රමයෙන් ගොඩනැගේ. දීර්ඝකාලිනමය ක්‍රියාමාර්ග තුල යුධමය වශයෙන් එල්ටිටිඊ සංවිධානය පරාජය කිරිමට ශ්‍රී ලංකා රජයට හැකියාව ලැබුනු අතර දෙමළ ජනතාව ගොඩනැගිමේ කාර්යයට, අභියෝගයට වර්තමාන දේශපාලන තන්ත්‍රය මුහුණදෙමින් සිටි. කෙසේ හෝ මෙම ජනවාර්ගික ගැටළු සඳහා බලපාන ලද හේතු, පාර්ශවකරුවන්,එහි ක්‍රියාමාර්ග, නිරාකරණ ප්‍රතිපත්තින්,ප්‍රචණ්ඩකාරිමය උච්චාවචනයන්, මැදිහත්කරුවන්, පශ්චාත් යුධ වාතාවරණයන් ආදි මුඛ්‍ය තේමා ගැල්ටුන්ගේ ගැටුම් අධ්‍යයන සංකල්ප මත හිඳ විග්‍රහ කිරීම මින් පසුවට සිදු වේ.

**ජොහාන් ගැල්ටුන්ගේ සංකල්ප භාවිතයෙන් ජනවාර්ගික ගැටුම විශ්ලේෂණය**

ගැල්ටුන් අධ්‍යයන විග්‍රහයෙහිලා මුලික වශයෙන් ද්විත්ව ගැටුම් ආකාරයක් යොදා ගනී,

- සමමිතික ගැටුම් (Symmetric Conflict)
- අසමමිතික ගැටුම් (Asymmetric Conflict)

සමමිතික ගැටුම් යනු සමාන මට්ටමේ පාර්ශවකරුවන් දෙකක් හෝ කිහිපයක් අතර ඇතිවන ගැටුම් වේ. මෙම ගැටුම් වලදී පාර්ශවකරුවන්ගේ සම්පත් හා තත්වයන් සමාන මට්ටමින් පවතී. ඉරාන ඉරාක යුද්ධය හා ඊශ්‍රායල් ඊජිප්තු යුද්ධය මේ ආකාරයෙන් හටගත් ගැටුම්ය. රාජ්‍යයන් අතර පමණක් නොව රාජ්‍යයන් අභ්‍යන්තරයේ ද මේ ආකාරයෙන් ගැටුම් ඇතිවිය හැක. මැදපෙරදිග ශුන්නි සහ ෂියාවරුන් අතර උද්ගතව ඇති ආගමික ගැටුම් උදාහරණ වේ. අසමමිතික ගැටුම් යනු අසමාන පාර්ශවකරුවන් අතර පැන නැගිය හැකි ගැටුම්ය. එනම් රටක මහ ජාතිය හා සුළු ජාතිය අතර පැනනගින ගැටුම් මේ සඳහා නිදසුන්ලා දැක්විය හැකිය. මේ අනුව අසමමිතික ගැටුම්වල ප්‍රධාන හේතුකාරකය වන්නේ පාර්ශවකරුවන් අතර පවත්නා සබඳතාවය නැතහොත් ව්‍යුහයයි. මේ නිසා

අසමමිතික ගැටුමක් යනු ව්‍යුහාත්මක ගැටුමකි. (Structural Asymmetric Conflict) 2009 මැයි මස නිමා වූ ශ්‍රී ලංකා රජය හා එල්ටීටීඊ සංවිධානය අතර පැවති යුද්ධය මේ ආකාරයේ ගැටුමකි. එය ජනවාර්ගික සාධකය මත පදනම් වු වෙනස්කොට සැලකීමේ ප්‍රතිඵලයකි. (Ethnic Discrimination)

ගැල්ටුන් විසින් ගැටුමක් ඇතිවීම විෂයෙහි අනුක්‍රමයෙන් සම්පූර්ණ වන සාධකයන් ත්‍රිත්වයක් සහිතව සුවිශේෂී සංකල්පයක් ගොඩනගා ඇත. එය ගැටුම් ත්‍රිකෝණයයි. (Conflict Triangle) පිළිබඳ සංකල්පය ලෙස හඳුනාගත හැක. ජොහාන් ගැල්ටුන් දක්වන ආකාරයට එම සාධකයන් ත්‍රිත්වය පහත දැක්වේ.




(Galtung , 2007)

මෙම සාධකයන්ගෙන් පළමුවැන්න නැතහොත් පළමුව ඇතිවන සාධකය කුමක්දැයි කිසිවෙකුටත් කිව නොහැකිය. මන්ද මෙම සාධකයන් අතුරින් ඕනෑම සාධකයකින් ආරම්භ වී අනෙක් සාධකයන් වෙත ගැටුම ගමන් කළහැකි නිසාය. මෙම ගැටුම් ත්‍රිකෝණය පහත පරිදි ජනවාර්ගික ගැටුමට අදාලව විග්‍රහ කළ හැකිය.

**ව්‍යුහය** (Structure)

ගැටුම් ව්‍යුහය අයත් වන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ට පරිබාහිරව නිර්මාණය වන පාරිසරික තත්වයන්ය. ඒ නිසා ගැටුම් ව්‍යුහය යන්න විෂයමූල සංසිද්ධියක් ලෙස හැඳින්විය හැකිය. රාජ්‍යයක් තුල ඇතිවන සමාජ, ආර්ථික, දේශපාලන තත්වයන්හි වෙනස්වීම් තුලින් නිර්මාණය වන ගැටුම් ව්‍යුහය යන්නට අයත් වේ.

“ ගැටුම් ව්‍යුහය යන්නට අදාලවන සමාජීය, ආර්ථිකමය හා දේශපාලනික තත්වයන් ගැටුම් බිහිකරනු වස් ඉවහල් වන පරිසරය නිර්මාණය කරයි. “
(ගැල්ටුන්,2004)

සමාජයීය සංදර්භය තුල දක්නට ලැබෙන අනන්‍යතාවයන් ගැටුම් ඇතිවීමට හේතු වේ. ඒ අනුව කුලභේදය, පංතිභේදය හා ජාතිභේදය හා වාර්ගික වෙනස්කම් ආදී වු සාධක ගැටුමට හේතු වන සමාජයීය කාරණාය. ලංකාවේ දෙමළ ජනතාව සුළුවාර්ගික කණ්ඩායමක් ලෙස සුවිශේෂී අනන්‍යතාවක් අත්පත්කරගෙන සිටින පිරිසකි. එම අනන්‍යතාවය තුල සිට එය ආරක්ෂා කර ගැනීමට එම පිරිස

නිරන්තර අරගලයක යෙදුනි. තමන්ගේ ආවේනික අනන්‍යතාවය හායනයට, ආන්තිකරණයට ලක්වීම තුල ගැටුම්කාරි පදනම්ගොඩනැගුණු අතර බහුතරවාදි අනන්‍යතාවයෙන් තම අනන්‍යතාවය ආරක්ෂා කර ගැනිම සඳහා දමිළ ජනතාව පෙළඹුනි.

**ආකල්ප**

ව්‍යුහයකට අදාල ගැටුමකට අවශ්‍ය පරිසරය නිර්මාණය වු විට එම පරිසරය තුල සැරිසරන පුද්ගලයා හෝ ප්‍රජාව තුල ගැටුමකට අවශ්‍ය මානසික තත්වය ගොඩනැගේ. මනෝවිද්‍යාත්මක සාධක හා ක්‍රියාදාම එහි අන්තර්ගතය. ඒ අතර අපේක්ෂාභංගත්වය, නොවිමසීම, වෛරය, ක්‍රෝධය, ආදි ගැටුමකට අවශ්‍ය ආකල්ප නොහොත් මුල්බැසගත් අගතින් නිර්මාණයවේ. එහිදී ප්‍රතිවිරුද්ධ පාර්ශව එකිනෙකා සම්බන්ධව ඇති කරගන්නා ප්‍රතිවිරුද්ධ හැගීම් හා සතුරු ප්‍රතිරූප බලපානු ලැබේ. උක්ත සංකල්පිමය හරය ලංකාවේ ගැටුමෙහි ප්‍රභවය හා ගලපමින් විශ්ලේෂණය කළ හැක.

1931 ඩොනමෝර් ප්‍රතිසංස්කරණයෙන් පසු බහුතර සිංහල ඡන්දදායකයින්ගේ ඡන්දයෙන් බහුතර සිංහල මන්ත්‍රි මණ්ඩලයක් ද, 1936 දි සර්ව සිංහල ඇමති මණ්ඩලයක් ද පත්විය. මේ තුල බහුතරවාදි නියෝජන ක්‍රමය ඔස්සේ සුළුතර අයිතින් ඉෂ්ට නොවන තත්වයක් ඇති වූ අතර සුළු ජාතින්ට හානිකර පනත් ඔවුන්ගේ අකමැත්ත තිබිය දි සම්මත කළ හැකි තත්වයක් උදා වුනි. මේ තුල 1944 සමස්තලංකා ද්‍රවිඩ සංගමය බිහිවන්නේ මෙබදු තත්වයක දී දමිල ජනතා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමටය ජී.ජී. පොන්නම්බලම් විසින් 50 ට 50 ඉල්ලිම් ඉදිරිපත් කළ ද එය ද අසාර්ථක විය. ජී.ජී. පොන්නම්බලම් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු පාලන සමයෙහි උතුරු - නැගෙනහිර ප්‍රදේශ වල කර්මාන්ත ශාලා තුනක් පිහිට වුහ. ඒවානම් වාලච්චේන කඩදාසි කම්හල, පරන්තන් රසායන කම්හල හා කන්කසන්තුරේ සිමෙන්ති කම්හල වේ. එහෙත් ඒ එකම අවස්ථාවයි. එදා සිට වර්තමානය දක්වා එම ප්‍රදේශ වලට එකම කර්මාන්ත ශාලාවක්වත් නොලැබුනි. එය ලාංකේය දේශපාලනයේ දි දමිළ ජනතාව නොසලකා හැරිමක් සහ ප්‍රතිවාදින් ලෙස සලකා බැහැර කිරිමේ ලක්ෂණය පෙන්නුම් කළ අවස්ථාවකි. මෙය ගැල්ටුන්ගේ විග්‍රහය තුල එන අපේක්ෂාභංගත්වය පිළිබඳ අදහස ගොඩනැගුනු අවස්ථාවකි. දෙමළ ජනයා තුල බහුතරවාදි සිංහල පාලනයේ ඒකපාර්ශවිය ප්‍රතිපත්ති රාමුව තුල ගොඩනැගුණු නිෂ්ක්‍රිය මානසිකත්වය හා ආකල්පය ස්ථිර විය.

පුරවැසි පනත ගෙනඒමෙන් මිලියනයක පමණ දමිළ ජනතාවගේ ඡන්ද අයිතිය අහෝසි කළ අතර 1956 ‘ සිංහල පමණක් ’ ප්‍රතිපත්තිය රටේ ප්‍රධාන දේශපාලන තේමා පාඨය විය.

- බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම බෞද්ධ භික්ෂූන්ගේ මෙහෙයවීමෙන් හා විරෝධතාවයන් නිසා ඉරා දැමීම.
- රජය අධිකරණ කටයුතු සිංහලෙන් පමණක් කළයුතු යැයි පනතක් සම්මත කිරීම.
- ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම (1956) බෞද්ධ භික්ෂුවගේ ක්‍රියාකාරකම් මත ඇණ හිටීම.

මෙම ප්‍රතිපත්තීන් නිසා උතුරු නැගෙනහිර ඇතුළු විවිධ පළාත්වල වෙසෙන දමිළ ජනයාට සිදුවූ අසාධාරණය සුළුපටු නොවේ. මේතුල ජාතික දේශපාලන තන්ත්‍රය කෙරෙහි වූ විශ්වාසය ක්‍රමක්‍රමයෙන් දමිළ ජනතාව තුලින් අඩුවෙන්නට පටන් ගත්හ. මෙය ගැටුම සඳහා මූලිකව පදනම් වූ සාධකය විය. 1966 ජනවාරි 08 දා දෙමළ භාෂා විධිවිධාන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදි. මෙහි අදහස වන්නේ උතුරු නැගෙනහිර ප්‍රදේශ තුල දමිළ භාෂාවෙන් වැඩ කටයුතු කිරීමේ අයිතිය ලබාදිය යුතු බවය. නමුත් මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත කරන අවස්ථාවේ දී විරුද්ධ පක්ෂය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා බෞද්ධ භික්ෂූන් එක්ව ගෙනගිය විරෝධතාවයන්ගෙන් පැහැදිලි වූයේ තම අවම ඉල්ලීමටවත් කන්දීමේ සූදානමක් දකුනේ නායකයන් තුල නොමැති බව දමිළ ජනතාවට තවදුරටත් තහවුරුවීමය. එනම් එක් පාර්ශවයකට අනෙක් පාර්ශවය පිළිබඳ අවිශ්වාසය ගොඩනැගීමේ ආකල්පය ගැටුමක් දක්වා වර්ධනයට මූලික පදනම් සාධකයක් විය. මෙය ගැල්ටුන්ගේ න්‍යායාත්මක විශ්ලේෂණයෙහි මූලික හරයකි.

ෆෙඩරල් පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා වාමාංශික නායකයන් පවා ප්‍රතික්ෂේප කරනු ලැබීම දමිළ ජනතාවගේ අයිතිවාසිකම් ප්‍රජාතාන්ත්‍රවාදී ක්‍රමයක් යටතේ දිනා ගැනීමට තිබෙන අවස්ථා පිළිබඳව දමිළ දේශපාලන පක්ෂ තුල විශාල සැකයක් හා කළකිරීමක් ජනිත කිරිම කෙරෙහි බලපෑවේය. ඒ වගේම, එතෙක් තිබූ සුළුජන ආරක්ෂණ විධිවිධාන 1972 ව්‍යවස්ථාවෙන් ඉවත් කිරීමක් සිදුවිය. භාෂාව පදනම්කරගත් ප්‍රමිතිකරණය දමිළ සිසුන්ට විශ්වවිද්‍යාල වලට ඇතුලත් වීමේ අවස්ථා අඩු කිරීමට බලපෑ නිසා තරුණ ප්‍රජාව තුල ආණ්ඩු විරෝධී ආකල්පයක් වර්ධනය වන්නට පටන් ගැනුනි.

1972 පෙඩරල් පක්ෂයට අමතරව ප්‍රධාන දමිළ පක්ෂ ගණනාවක් එක්ව යෝජනා මාලාවක් සකස් කළ අතර ඉන් කිහිපයක් නම්,

* දෙමළ භාෂාවට සම තැන දීම.
* පුරවැසි පනතින් පුරවැසිභාවය අහෝසිවූවන්ට පුරවැසිභාවය යළි ලබා දීම.
* රජය ආගමික විශේෂිකරණය නොකරන ලෞකික ආයතනයක් වීම.
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කුල අසාධාරණය අහෝසි කිරීම.
* සහභාගිත්ව ප්‍රජාතාන්ත්‍රවාදය අර්ථවත් වන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යුහය විමධ්‍යගත කිරීම.

(විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 2010)

මේ අනුව දමිළ ජනතාවට තම අයිතිවාසිකම් ප්‍රජාතාන්ත්‍රවාදී ව්‍යුහයක් තුල දිනා ගැනීමට තිබූ අවස්ථා ඇහිරින. තිබූ විශ්වාසය ක්ෂයවී ගිය අතර නිරන්තර වෛරය ක්‍රමයෙන් ප්‍රධාන දේශපාලන ධාරාව මෙහෙය වූ පාර්ශවය වෙත යොමු විය. එනම් ගැටුමක් සඳහා අවශ්‍ය පූර්ව මානසිකත්වය මේ තුල

ගොඩ නැගුණි. ව්‍යුහය සහ ආකල්ප යන අංග ද්විත්වයම සම්පූර්ණ වුවද සිදු වන්නේ ගැටුමට අවශ්‍ය පදනම සකස්විමක් පමණි.

**චර්යාව**

චර්යාව යනු ප්‍රකාශිත මට්ටමේ හැසිරීම නොහොත් ක්‍රියාකාරකම්ය. හැසිරීම සිදුවන්නේ ආකල්පයන්ට අනුවය. එසේම එම ආකල්පය නිර්මාණය විඇත්තේ පුද්ගලයා හෝ කණ්ඩායම ජීවත්වන පරිසරය ප්‍රකාරවය.

ගැටුමක් යනු ව්‍යුහය තුළින් පරිසරය සකස් වී ආකල්ප හරහා උද්දීපනය වි චර්යාව තුළින් ක්‍රියාවට නැංවෙන දෙයක් ලෙස හැඳින්විමට හැක.

(ගැල්ටුන්, 1968)

චර්යාව යන්න විග්‍රහ කිරීමේදී එහි පවතින සුවිශේෂිම ලක්ෂණය වන්නේ, ගැටුමක් යන්න බාහිරට ප්‍රකාශ වන්නේ චර්යාව තුළින් විමයි. එම නිසා ගැටුමක තිව්‍රතාවය ගැටුමෙහි විනාශකාරි බව සහ ගැටුම් ප්‍රවේශය ආදි ලෙස වු ගැටුම පිළිබඳව කෙරෙහි දහසකුත් විශ්ලේෂණයන් සිදුවන්නේ චර්යාව නිරීක්ෂණය කිරිමෙන් වීම ප්‍රධාන ලක්ෂණයකි. චර්යාව හරහා ගැටුමක් පැන නොනගින තාක්කල් ගැටුමක් යන්න ඇති නොවේ. එම නිසා චර්යාව ගැටුමක වැදගත් අංගයකි.

පුද්ගලයෙන් හෝ වෙනත් පාර්ශවයක් හෝ අනෙක් පාර්ශවය වෙත දක්වන පළමු ප්‍රතිචාරයේ සිට ගැටුමේ උච්චතම අවස්ථාව දක්වා වු සියලු හැසිරීම් ගැටුම් ත්‍රිකෝණයෙහි එන චර්යාව යන්නට අදාළ වේ. එබැවින් ප්‍රතිපාර්ශවය කෙරෙහි වාචිකව ප්‍රතිචාර දක්වන අවස්ථාවද අදාළ වන්නේ චර්යාව යන සාධකයටය. මේ අනුව ගැටුමක් ඇතිවිමට පෙර ඇතිවන බැනවැදිම්, තර්ජනය කිරීම, බියගැන්විම් ආදි වු වාචික ප්‍රචණ්ඩත්වයන් ද චර්යාව යන්නට අදාළ වේ. අවි ආයුධ භාවිතා කරමින් සිදුකරන ජන ඝාතන හා අතුරුදහන් කිරිම් චර්යාවට අයත්වන අනෙකුත් ක්‍රියාකාරකම් වේ.

කණ්ඩායම් විසින් එකිනෙකාට අනතුරු කිරිම ආරම්භ කරන විට ගැටුම් චර්යාවන් ප්‍රකටව පෙන්නුම් කෙරේ.

(දික්වැල්ල,ප්‍රියන්ත,හෙට්ටිආරච්චි, 2003)

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටළුව විෂයෙහිලා දෙමළ ජනතාව තුළ ආකල්පමය වශයෙන් ගැටුමක් සඳහා පරිවර්තනය වන ආකාරයේ මනෝභාව ගොඩනැගිම තුළ ශ්‍රී ලංකා රජය ද යම් යම් ප්‍රතිචාර දක්වුහ. ලංකා ආණ්ඩුවේ ක්‍රියාමාර්ග වලට අනුව ඔවුන් ප්‍රතිචාර දක්වුයේ මේවනතෙක්

ගොඩනැගුණු සෘණාත්මක ආකල්පයන් හි පීඩනය මුදාහැරීමක් ලෙසය. උදාහරණ වශයෙන් ආණ්ඩුවේ "සිංහල පමණක්" ප්‍රතිපත්තියට එරෙහිව උතුරේ මෙන්ම දකුණේ ජනතාව ද තම විරෝධය පළ කළහ. 1961 දමිළ දේශපාලන පක්ෂවල මෙහෙයවීම මත ගාලුමුවදොර පැවැත් වූ සාමකාමී සත්‍යග්‍රහයට රජය ප්‍රතිචාර දක්වූයේ හදිසි නිතිය ප්‍රකාශයට පත්කර ප්‍රචණ්ඩත්වය යොදා මර්දනය කිරීමෙනි. ප්‍රජාතන්ත්‍රවාදි විරෝධතා දක්වීමේ ක්‍රමයක් ලෙස සත්‍යග්‍රහ පැවැත්වීම සඳහා දමිළ ජනතාව පෙළඹුනේ ආකල්පමය වශයෙන් ඇතිවූ තත්වයන්හි ප්‍රකාශනයක් ලෙසය.

ජනරජ ව්‍යවස්ථාවේ විධිවිධානවල ඊකවරණ වැඩිහරියක් සිංහලයන්ට පමණක් විමේ හා දමිළ ජනතාව නොසළකා හැරිමේ හේතුව මත එයට එරෙහිව උතුරු නැගෙනහිර සාමකාමී විරෝධි ව්‍යාපාර ඇතිවිය. එහෙත් මෙහිදි සමගි පෙරමුණු ආණ්ඩුව සාමකාමිව විරෝධය පෑ තරුණ තරුණයින් අත්අඩංගුවට ගැනිමටද කටයුතු කළේය. මේ අනුව උමා මහේෂ්වරන්, කාසි ආනන්දන් වැනි උද්යෝගිමත් තරුණ නායකයින් සිරගත කෙරින. ඒ වගේම 1974 වර්ෂයේ යාපනයේ දමිළ භාෂා පර්යේෂණ සමුළුව අවසානයේ සිදු වූ පොලිස් වෙඩිතැබිම් නිසා නවදෙනෙක් මරුමුවට පත්වුහ. මෙසේ රාජ්‍ය මර්දනය උග්‍රවත්ම සාම්ප්‍රදායික දමිළ නායකයන්ගේ ප්‍රතිපත්ති කෙරෙහි කළකිරිමක් මෙන්ම විරෝධයක් ද වර්ධනය වුනි.

තම ප්‍රතිපාර්ශවය විසින් නැතහොත් ලංකාණ්ඩුව මගින් තමන්ගේ අයිතිවාසිකම් දිගින් දිගටම උල්ලංඝන විම තුළ 1972 දී පෙඩරල් පක්ෂය තවත් දමිළ දේශපාලන පක්ෂ 4 ක් සමග ඒකාබද්ධව දමිළ එක්සත් විමුක්ති පෙරමුණ පිහිටුවා ගන්නා ලදී තම ජනවර්ගය කෙරෙහි ලංකා ආණ්ඩුවෙහි චර්යාව සාධනිය එකක් නොවූ හෙයින්, ප්‍රචන්ජකාරි එකක් වූ බැවින් මෙලෙස ඊට ප්‍රතිචාර දක්වීමෙහි ලා මෙසේ සංවිධානය විය. ඒ අනුව දමිළ එක්සත් විමුක්ති පෙරමුණ 1976 මැයි 14 දා වඩුක්කොඩෙයි ආසනයේ ජාතික සම්මේලනයක් කැඳවා දමිළ ජනතාවගේ නිදහස වෙනුවෙන් ඊලාම් රාජ්‍යක් ඇතිකරගත යුතු බවට ප්‍රකාශයට පත්කළේය.

* 1972 මෙන් 1978 දිද ඒකපාර්ශවිය ව්‍යවස්ථාවක් සම්පාදනය.
* 1979 දී පනවන ලද හදිසි නීතිය අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ උතුරු නැගෙනහිර " ත්‍රස්තවාදය තුරන්කරලිමේ මෙහෙයුමක්" දියත් කිරීම තුල දමිළ තරුණයින් අත්අඩංගුවට ගැනිම, පහරදීම් සහ මරා දැමීම.
* වෙනම රාජ්‍යක් ඉල්ලිම ඔස්සේ පාර්ලිමේන්තුවට පත් වූ ද්‍රවිඩ මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධූර පාර්ලිමේන්තුවට නොපැමිණීමෙන් අහෝසි කිරීම.
* උතුරට ගිය සිංහල නායකයෝ මැර බලය යොදා යාපනයේ හඳවත බඳු මහජන පුස්තකාලය ගිණි තබා විනාශ කිරීම දක්වා ප්‍රචණ්ඩත්වය ව්‍යාප්ත කිරීම.

මේ ආකාර සියළු ක්‍රියාමාර්ග සිදු වූයේ කෙසේද? මින් පැහැදිලි වන්නේ ගැටුම් ක්‍රියාදාමයෙහි චර්යාත්මක ක්‍රියාශීලිත්වයයි. ආණ්ඩුවේ මර්දනකාරි ක්‍රියාමාර්ග තුල දමිළ ජනතාවගේ අවසාන චර්යාත්මක ක්‍රමවේදය වූයේ ඊලාම් රාජ්‍ය ප්‍රකාශ කරීම හා ඒ වටා දමිළ ජනතාව සංවිධානගත කිරිමයි.

එම චර්යාව ප්‍රකාශ කරීම සඳහා මේ වන තෙක් ප්‍රතිපාර්ශවීය ප්‍රතිචාර තුල මුල්බැසගත් ආකල්ප ඉවහල් විය. එබැවින් ගැල්ටුන් දක්වන ආකාරයට ගැටුමක් නිරාකරණය වස් ගන්නා ප්‍රයත්නයන් ද චර්යාව වැළැක්වීම අරමුණු කරගෙන පමණක් ක්‍රියාත්මක වීම ප්‍රමාණවත් නොවන බවත්, ඊට ඔබ්බෙහි අප්‍රකාශිත තත්වයෙහි පවතින ආකල්ප වෙනසක් උදෙසා ද මෙහෙයවිය යුතු බවත් වටහා ගත යුතුය. එසේම ගැටුමට සැබෑ හේතූන් ගැටුම් ව්‍යුහය තුල අන්තර්ගත වී ඇති බැවින් ඒ දක්වාද නිරාකරණ ක්‍රියාවලියක් විකාශනය විය යුතු බව මෙමගින් තවදුරටත් පෙන්වා දෙයි.

එල්ටීටීඊ සංවිධානය යුධමය වශයෙන් පරාජය කිරීම තුල යම් ජයග්‍රණ අත්පත් කරගත්ත ද දමිළ ජනතාවගේ සැබෑ අවශ්‍යතා, උවමනාවන්, ඉල්ලීම් කවරෙක් ද? බහුතරවාදී සිංහල පාලන ක්‍රමය තුල තම ප්‍රජාව සම්බන්ධව ඇති ආකල්පීමය ප්‍රතිචාර කවරේද? ජාතික දේශපාලනය තුල සාධාරණ හා අපක්ෂපාති ප්‍රතිපත්ති සඳහා ඇති පෙළඹුම් මොනවාද ? දමිළ ජනතාව ඒකාග්‍රකරණයෙහිලා ඇති සාධනීය දෘෂ්ටිය කෙසේ ද? එහි ස්වභාවය කුමක් ද? විශේෂයෙන් දමිළ ජනතාව ප්‍රජාවක් ලෙස තේරුම්ගැනිම හා ලාංකේය ජාතිය ගොඩනැගෙහිමිලා එම ප්‍රජාව ආමන්ත්‍රණය කරීම ආදි ක්‍රියාමාර්ග හරහා දෙමළ හා සිංහල ප්‍රජාවන් ද්විත්වයෙහි ආකල්පිමය වෙනස්කම් සිදුකළ යුතුය. නැතහොත් ගැටුම යන්න නිමාවක් නොව යලි ඇරඹුමකි. හුදු යුධමය ක්‍රියාමාර්ගයකින් පමණක් ගැටුමක් සම්පුර්ණයෙන් නිරාකරණය වනවා යැයි කීම මුලාවකි. ගැටුමක් නිරාකරණයෙහිලා ගැටුමට පදනම් වු ව්‍යුහය හා ආකල්ප ආමන්ත්‍රණය කළ යුතුමය.

ඒ අනුව ගැටුම් ත්‍රිකෝණය ගැටුමක් ඇතිවන ආකාරය පෙන්වා දිම සඳහා පමණක් සිමා නොවන අතර ගැටුමක් නිරාකරණය කරනු වස් අවශ්‍ය වන සාක්ෂි සහ සාධකයන් සපයා ගැනීමට ද, නිරාකරණ ක්‍රියාවලිය පහසු කිරීමට ද, අවශ්‍ය සහයෝගය ලබාදේ.

## ගැල්ටුන්ගේ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සංකල්පය හා ජනවාර්ගික ගැටුම

නිශ්චිත ගැටුමක් යම් ප්‍රමාණයක මෝරායෑමෙන් පසුව අභ්‍යන්තර වෛරය, කෝපය හා පරිසර සාධකයන්හි හේතුන්ද මත ප්‍රතිපාර්ශවය කෙරෙහි ප්‍රචණ්ඩකාරීත්වය මුදා හැරීම සිදුවේ. පූර්ණ තෘප්තිමත් භාවය නොවීම සහ ඉච්ඡාභංගත්වය මෙහිදී මූලික සාධක වේ. ප්‍රචණ්ඩත්වය සඳහා බලපාන හේතු මුලයන් රාශියක් පවතින අතර එහි උච්ඡස්ථානය වන්නේ මනුෂ්‍ය ඝාතනයන්ය. ඕහාචාර්ය ගැල්ටුන් මෙම ප්‍රචණ්ඩත්වය ආකාර තුනකින් දකී.



සංස්කෘතික ප්‍රචණ්ඩත්වය
( Cultural Violence)

සෘජු ප්‍රචණ්ඩත්වය
( Direct Violence)

(Stalenoi, 2014)

මෙහි සෘජු ප්‍රචණ්ඩත්වය යනු ව්‍යුහාත්මක නොවන, දෘශ්‍යමාන වන කායික පරපීඩනයන් යොදා ගනිමින් සිදු වන්නා වූ ප්‍රචණ්ඩත්වයයි. ඒ යටතට ඝාතන, පහරදීම්, පළිගැනීම්, තර්ජනය කිරීම් හා දූෂණයන් අයත් වේ. යුද්ධ සහ විප්ලව මගින් සිදුවන මහා ජනඝාතන මෙම සෘජු ප්‍රචණ්ඩත්වය හරහා සිදුවේ. ලංකාවේ ජනවාර්ගික ගැටළුව මුල් කාලීනව ප්‍රචණ්ඩකාරි ස්වරූපයක් නොගත් නමුත් 2000 සහ විශේෂයෙන් 2005 වර්ෂයෙන් පසුව දැඩි ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගන්නා ලදී. ගැටුම් පාර්ශවයන් ද්විත්වයේම සෘජු සටන් වලට යොමු වූ අතර ඒ තුල දෙපාර්ශවයේම දහස් ගණනක් සොල්දාදුවන් ඝාතනය විය. එය පහත ප්‍රස්ථාරගත දත්තයන්ගෙන් මනාව ඔප්පු වේ.




(Sri Lanka–war–casualities-estimate.com )

ප්‍රචණ්ඩත්වය තුල සිදුවන මනුෂ්‍ය ඝාතනයන්ට සාපේක්ෂව එම මිය යන්නන්ගේ පවුල් හා දරුවන් තුල සිදුවන කඩාවැටීම්, අපේක්ෂාභංගත්වයන්, ස්ථාවර නොවූ ආර්ථික ක්‍රමයමත නිශ්චිත ආදායමක් නොමැතිවීම හා ඒතුල පවුල් ඒකක බිඳීයාම, අධ්‍යාපනය කඩාවැටීම් හා දරුවන්ට අනාරක්ෂිත තත්වයක් හිමිවීම ආදී පශ්චාත් යුධ තත්වයෙහි නිශේධනීය ප්‍රතිඵල රාශියක් සිදුවිය. එය ලංකාවේ පශ්චාත් ගැටුම් පරිසර තත්වය විග්‍රහයේ දී මනාව තහවුරු විය.

ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය (Structural Violence) යන්නට මූලික වශයෙන් දෘශ්‍යමාන නොවූ ප්‍රචණ්ඩත්වය හා ආයතනිකමය ව්‍යුහයන් හා සමාජ ක්‍රමය මත ගොඩනැගුණු අසාධාරණකම් (Discrimination) අදාල වේ. මෙය බොහෝ විට සමාජ ව්‍යුහය ( Social Structure) හා සමාජ පද්ධතීන් (Social System) තුල දකින්නට ලැබේ.

අසාධාරණකම්
(Discrimination)

- අධ්‍යාපන අසාධාරණකම්
- වාර්ගික අසාධාරණකම්
- ආගමික අසාධාරණකම්
- ආර්ථික අසාධාරණකම්
- සමාජ අසාධාරණකම්
- දේශපාලන අසාධාරණකම්
- ලිංගික අසාධාරණකම්
- කුල අසාධාරණකම්

ජනවාර්ගික ගැටුමට අදාල විග්‍රහයේ දී බොහෝ විට සිදුවූයේ දේශපාලනික අසාධාරණකම් මත වූ විභේදනය තුල ගොඩනැගුණු ප්‍රචණ්ඩත්වයයි. අසමතුලිත දේශපාලන නියෝජනය, අතුලිත දේශපාලන ප්‍රතිපත්ති එහිලා මූලික විය. විශේෂයෙන් අධ්‍යාපනය තුල දෙමළ සිසුන්ගේ විශ්වවිද්‍යාල ප්‍රවේශය වාර්ගිකත්වය පදනම්කරගෙන සීමාකිරීම තුල ඇති වූ අසාධාරණය පසුකාලීන දැඩි ප්‍රචණ්ඩත්වයකට හේතුවිය. විශ්වවිද්‍යාල ප්‍රමිතිගතකරණයට එරෙහිව උතුරු නැගෙනහිර සිසුන් දහස් ගණනින් වීදි බසින තත්වයක් උදාවිය. ඒ තුල ආණ්ඩුව ප්‍රචණ්ඩත්වය යොදාගෙන සිසු මර්දනය ආරම්භ කරන ලදී. රටේ මූලික නීතිය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් දෙමළ භාෂාව සහ හින්දු ආගම පිළිබඳව සිදු කරන

ලද අසමාන සැළකිල්ල තුලද දමිළ ජනතාව තුල අස්ථාවර වු අවිස්වාස සහගත හැඟීම් ඉස්මතු විය. විශේෂිකරණය කරණ ලද ජාතික, ආගමික හා  භාෂා ප්‍රතිපත්තියක් මත එය සිදු විය.

ප්‍රචණ්ඩත්වය සම්බන්ධව මහාචාර්ය ගැල්ටුන්ගේ මුඛ්‍ය අදහස ජනවාර්ගික ගැටුමට අදාල කරගනිමින් පහත පරිදි කැටිකොට ගත හැක.




- ආකල්ප හැඟීම් වටිනාකම්
- බද්ධ වෛරය
- අවිශ්වාසය
- නොඉවසීම

- වෙනස්කොට සැලකිම
  - අධ්‍යාපනික
  - වෘත්තීමය
- අයිතීන් හා විමුක්තිය නොපිළිගැනීම
- වෙන්කොට සැළකීම

ලංකාවේ ජනවාර්ගික ගැටුම තුළ සිදුවුයේ ව්‍යුහාත්මක හා ආකල්පමය ප්‍රචණ්ඩත්වයන්ට හේතුවන සාධක දිගුකලක් තිස්සේ ගොඩනැගෙමින් එකතැන් පල්විමකි. එය ක්‍රමයෙන් වර්ධනය වු කාරණා වු අතර එකී කාරණා අවමකරණයෙහි ලා වු රාජ්‍ය උත්සහයන් හෝ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල පසුගාමී විය. සාධනීය මෙන්ම ඵලදායි තත්වයක නොවිය. විශේෂයෙන් වෙනස් කොට සැළකිම යන්න ලංකාවේ ගැටුමට මුලිකව බලපෑ ව්‍යුහාත්මක සාධකය විය. තමන් රාජ්‍යය තුල සමාන අයිතින්  හා අවස්ථාවන් භුක්ති නොවිදින ජනවාර්ගිකයන්ය යන ආකල්පය තුළ ස්වභාවිතවම ආන්තිකරන තත්වයන්

ගොඩනැගේ. එය අවසානයේ සෘජු ප්‍රචණ්ඩත්වයක් බවට පරිවර්තනය වුයේ ශ්‍රී ලංකා රජයේ හමුදාවන් සමඟ සෘජු යුධමය ක්‍රියාමාර්ගයන්ට පෙළඹීම තුළය.




ගැල්වුන් දක්වන ආකාරයට ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා ඉහත උපාය මාර්ග ත්‍රිත්වය මනාව කළමණාකරණය කලයුතු වේ. ගැටුමට පෙරනම් එය වැළැක්වීමට හෝ ආරක්ෂාව තර කිරීම අත්‍යාවශ්‍ය සේම ගැටුම් කාලය තුළ සාමය තබාගැනිම සඳහා අර්ථාන්විත මෙන්ම ගරු කටයුතු (respectful dialogs) පාර්ශව අතර සිදුවීම වැදගත්වේ. එය ප්‍රචණ්ඩත්වය අවම කරයි. ලංකාවේ ගැටුම ආරම්භ වී ඉදිරියට පියවරෙන් පියවර පැමිණීම තුළ ගැටළුවට තිරසර විසදුම් සෙවීමට විවිධ බහුපාර්ශවිය ද්විපාර්ශවිය සාකච්චා සිදුවිය. ඒ අතර

* 1985 තිත්පු සාකච්ඡා
* 1987 ඉන්දුලංකා ගිවිසුම ඔස්සේ පළාත් සභා පිහිටුවීම
* බලතල විමධ්‍යගත කිරීම සඳහා 13 වන සංශෝධනය
* 1994 ජනාධිපතිවරණ යෝජනා
* 1995 හා 1997 පොදු පෙරමුණු යෝජනා
* 2002 දි අත්සන් කල අවබෝධතා ගිවිසුම

මෙම සටන් විරාම ගිවිසුම හරහා ඇති විමට ගිය ප්‍රචණ්ඩත්වය බොහෝ දුරට පාලනය කිරීමට හැකි වු බව පෙන්වා දිය හැක. 2002 සැප්තැම්බර් මස තායිලන්තයේ පැවැත්වූ ප්‍රථම සාකච්ඡා වල බිම් බෝම්බ ඉවත් කිරිම හා අවතැන්වූවන් නැවත පදිංචි කිරීම පිළිබඳ සාකච්ඡා සිදු විය. 2002 දෙසැම්බර් නෝර්වේ ඔස්ලෝහිදි 3 වන සාකච්ඡා වටයක් ද පැවැත්වුහ. මේ සාකච්ඡා වටයන් තුළ විවිධ වු තීරණයන්ට එළඹුන අතර දෙපාර්ශවයම සක්‍රීයව සම්බන්ධ විය. කෙසේ හෝ 2003 දී එල්ටිටිඊ සංවිධානය විසින් අගමැති රනිල් වික්‍රමසිංහ වෙල එවන ලද ලිපියක සඳහන් වුයේ තම සංවිධානය කිසියම් කාලයක් සාකච්ඡා වලට සහභාගි විමෙන් වැළකි සිටින බවයි. එහෙත් සාකච්ඡාමාර්ග ක්‍රියාවලියක් සඳහා සංවිධානය කැපවි සිටින බව ද ඔවුන් විසින් අවධාරණය කෙරිනි.

ගැටුම අවසන් වු පසු අවධිය ද තිරණාත්මකය. විශේෂයෙන් සාධාරණත්වය ඉටු කිරීම හා අනොන්‍ය ගැටුම් පාර්ශවයන් අතර අවබෝධය ප්‍රවර්ධනය කිරීම, සමාජ බෙදීම් නිශ්ක්‍රීය කිරීම හා අසාධාරණයට ලක්විමේ භාවිතාවන් දුරලා ශක්තිමත් ප්‍රජා සම්බන්ධතා සංවර්ධනය තුල සාමය ගොඩනැගීම. (Peace Building) යන්න යථාර්ථයක් වේ. මෙය වර්තමානයේ පශ්චාත් යුධ පරිසරය තුල සිදුකරමින් පවතින ක්‍රියාවලියකි.

ගැල්ටුන් සාමය දෙයාකාර ලෙස දක්වයි.

1) නිශේධනාත්මක සාමය. (Negative Peace)

2) සාධනාත්මක සාමය (Positive Peace)

(www.conflictanlysis.cc.lk)

දෘශ්‍යමාන ප්‍රචණ්ඩත්වය නැතහොත් ඍජු ප්‍රචණ්ඩත්වය අවම කිරීමෙන් නිශේධනාත්මක සාමය ලගාකරගත හැකිබව ගැල්ටුන් පෙන්වාදේ. ඒ වගේම දෘශ්‍යමාන නොවන ප්‍රචණ්ඩත්වය එනම් ව්‍යුහාත්මක හා ආකල්පමය ප්‍රචණ්ඩත්වය අවම කිරීමෙන් සාධනාත්මක සාමය (සැබෑ සාමය) ළගාකරගත හැකි බව දක්වයි. සාධාරණත්වය සහ ධනාත්මක සාමය අත්පත් කරගැනීමට නම්, පංතිය, ජනවාර්ගිකත්වය, ආගම, කුලය හා ලිංගිකත්වය මත පදනම්වන සියළු ආකාරයේ වෙනස්කොට සැළකීමේ ආකාරයන් බැහැර කළ යුතුය. ජනවාර්ගික ගැටළුවට පදනම්වු මෙම වෙනස්කොට සැළකිම යන්නට කෙටි හෝ ක්ෂණික පිළියම් නොමැත. දෙමළ ජනතාවතුළ තමන් ද සිංහල ජනවර්ගය මෙන්ම සියළු අවස්ථාවන්ට, අයිතීන්ට එකසේ හිමිකම් කිව හැකිය යන හැඟීම ශක්තිමත්ව මුල්බැස ගැනීම හරහා පමණක්ම උක්ත සාධනාත්මක සාමය දිගුකාලීනව ගොඩනැගිය හැක. එම ආකල්පය දෙමළ ජනතාව තුල ස්ථාපිත නොවන තාක්කල් අර්ථාන්විත වු පරිපූර්ණ සාමයක් බලාපොරොත්තු වියහැකි නොවේ.

මේ ආකාරයට මහාචාර්ය ජොහාන් ගැල්ටුන් ගැටුම් අධ්‍යයනයෙහිලා ඉදිරිපත් කර ඇති ගැටුම් ත්‍රිකෝණය, ප්‍රචණ්ඩත්වය හා සාමය පිළිබඳ න්‍යායාත්මක සංකල්ප ශ්‍රී ලංකාවේ ජන වාර්ගික ගැටුම හා ගලපමින් විශ්ලේෂණය කර ගත හැක. විශේෂයෙන් ගැල්ටුන්ගේ සංකල්පයන් හි පවතින වර්තමාන

වලංගුතා මෙන්ම එහි ඇති මුලධර්ම ඕනෑම ගැටුමකට සම්බන්ධ කිරීමේ හැකියාව ඉතා ඉහල තලයක පවතී. ගැටුම් තේරුම් ගැනීමට හා එය නිශ්චිත විසඳුමකින් අවසන්විම දක්වා වු දීර්ඝ ක්‍රියාවලිය තුල ගැල්ටුන් ගෙනඑන හරයන් අතිශයින් බලපෑම්සහගත වනවාසේම හරයාත්මක වශයෙන් වඩා ඵලදායි ඉහත ස්ථානිය අගයක පවතින බව පැහැදිලිව දැකිය හැකිය.

wkqrdO f;kakfldaka

foaYmd,k úoHd wdpd¾h

## ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමට බලපෑ මූල හේතූන් හා එහි වර්ධනයට බලපෑ තත්වයන් විමර්ශනය කරන්න.

ලෝකයේ පවතින ගැටුම් අතරින් ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුම දිග්ගැස්සුනු සමාජ ගැටුමක් ලෙස හඳුනාගත හැක. දශක තුනකට අධික කාලයක් තිස්සේ සිට පැවති මෙම අර්බුදය වෙතින් මෙරට දේශපාලන, සමාජ හා ආර්ථික ක්ෂේත්‍රයට සිදුවී ඇති තත්වය සේම රාජ්‍යයක් ලෙස එය අත්දුටු ආකාරය තේරුම් ගැනීම සරල කාරණයක් ලෙස ගතහැකි නොවේ. ආරම්භයේදී ජාතික මට්ටමින් ක්‍රියාත්මක වූ මෙම ගැටුමෙහි ඉතිහාසය හුදෙක් දශක ත්‍රිත්වකට සීමා නොවේ. විශේෂයෙන් ගැටුම සඳහා බලපාන ලද මූල හේතූන් පිළිබඳ විග්‍රහයේ දී එය ලංකාව නිදහස ලැබීමටත් පෙර යුගය දක්වා දිවේ.

ශ්‍රී ලංකාව බහුවාර්ගික හා බහු ආගමික සමාජයක් වන හෙයින් ජනවර්ගවල භාෂාමය සංස්කෘතිකමය අනන්‍යතාව ආරක්ෂා පිළිබඳ කතිකාවතත් 1920 දශකයේ පටන්ම මෙරට පැවත තිබේ. 1926 එස්.ඩබ්.ආර්.ඩී. බන්ඩාරනායක විසින් යෝජනා කරන ලද ෆෙඩරල් සංකල්පයට පදනම වූයේ ද මේ අදහස බව ඉතිහාසය කියැවීමේ දී පැහැදිලි වේ. පහතරට සිංහලයන්ගේ ආර්ථික බලය හා දේශපාලන බලය ව්‍යාප්ත වීමට සාපේක්ෂව තමන් කොන්වේය යන බිය උඩරට සිංහලයන්ට තිබූ අතර ඔවුන් 1927 දි ඩොනමෝර් කොමිසමට තම ඉල්ලීම් ඉදිරිපත් කළේය. ඒ උතුරු නැගෙනහිර, බස්නාහිර හා දකුණ මෙන්ම උඩරට වශයෙන් ආණ්ඩු 3 ක් ඇතිකල යුතු බවටයි. මෙම නවිකරණ අදහස ඉදිරිපත් කල බණ්ඩාරනායක මහතා පසුව පටු දේශපාලන ප්‍රවනතාවලට යටපත්විය. කෙසේ හෝ විසිවැනි සියවසේ කුල පදනම සළකා බලන ලද වුවත් ජාතිකත්ව විඥානයකින් තොරව මහජන නියෝජිතයන් තේරිපත් වූ අතර 1912 රාජ්‍ය මන්ත්‍රණ සභාවට ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් පත්වූයේ බහුතර සිංහල ඡන්ද දායකයන්ගේ ඡන්දයෙනි. 1919 දි ඇරඹූ ලංකා ජාතික සංගමයෙ බහුතර සිංහල ජාතිකයන් වූ අතර එහි ප්‍රථම සභාපතිවරයා වූයේ පොන්නම්බලම් අරුණාචලම්ය.

### ඩොනමෝර් ප්‍රතිසංස්කරණ

1931 දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණ වලින් පසු නියෝජන ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමය ඔස්සේ බහුතර සිංහල ඡන්ද දායකයන්ගේ ඡන්දයෙන් බහුතර ඇමති මණ්ඩලයක්ද පත්විය. මේ අනුව බහුතරවාදි නියෝජන ක්‍රමය ඔස්සේ සුළුතර ජාතින්ගේ අයිතිවාසිකම් ඉෂ්ට නොවන වාතාවරණයක් ඇතිවිය. සුළුතර ජාතින්ට හානිකර අන්දමින් බලපෑමට ඉඩ ඇති පනතක් ඔවුන්ගේ අකමැත්ත තිබියදී සම්මත කරගත හැකි වාතාවරණයක් ඒ අනුව ඇතිවිය.

1944 දි සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය බිහිවන්නේ මෙබඳු වාතාවරණයකදී දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා පෙනි සිටිමද වෙනුවෙනි. මෙසේ සිංහල ජන නායකයන් සහ දමිළ ජන නායකයන් අතර අවිශ්වාසය හා විරසකය මතුවිම ජනවාර්ගික ගැටුමේ මූලහේතූන් සඳහා පරිසරය ගොඩනගන ලදී.

**සොල්බරි ප්‍රතිසංස්කරණය**

1947 දී ක්‍රියාත්මක වූ සොල්බරි ව්‍යවස්ථාව යටතේ ගොඩනැගූ පාර්ලිමේන්තුව තුළ සම්මත වන අණපනත් වැඩි ඡන්දයෙන් සම්මතවන හෙයින් එය සිංහල බහුතරයට පමණක් වාසිගෙන දෙන සුළු ජාතීන්ට අවාසිදායක වන බවට සුළුතර මහජන නියෝජිතයන්ට බියක් ඇති වූ අතර ඒ නිසාම ජී.ජී. පොන්නම්බලම් 50 ට 50 ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී. 1947 බලයට පත් වූ එක්සත්ජාතික පක්ෂ ආණ්ඩුව ලංකා ද්‍රවිඩ සංගමයේ නායක ටී.ටී. පොන්නම්බලම් එහි ඇමතිවරයෙකු ලෙස පත්කල අතර ඒ සමයෙහි ඔහු උතුරු නැගෙනහිර කර්මාන්තශාලා තුනක් පිහිටුවූහ. එනම් වාලච්චේන කඩදාසි කම්හල, කන්කසන්තුරේ සිමෙන්ති කම්හල හා පරන්තන් රසායන කම්හලයි. එහෙත් ඒ එකම අවස්ථාවයි. එදා සිට අද දක්වා එම ප්‍රදේශවලට එලෙස කර්මාන්ත ශාලා ලැබිනැත. එය ලාංකේය දේශපාලනයෙහි දමිළ ජනතාව නොසළකා හැරිම සහ ප්‍රතිවාදීන් බැහැර කිරිමේ ලක්ෂණය පෙන්නුම් කල අවස්ථාවකි.

**පුරවැසි පනත**

එක්සත් ජාතික පක්ෂ රජයෙහි අගමැති ඩී.එස්. සේනානායක පුරවැසි පනත නමින් නව පනතක් ඉදිරිපත් කල අතර එය වතුකරයේ දමිළ ජනතාවගේ මිලියනයක පමණ ඡන්ද අයිතියත් පුරවැසිභාවයත් අහෝසිකලේය. එයට හේතුව වුයේ වතු දමිළ ජනතාව 1947 මැතිවරණයේදි වාමාංශික නැඹුරුවක් දක්විමයි. ඒ තුළ එම දෙමළ ජනතාව දේශපාලන වශයෙන් අකර්මන්‍ය තත්වයට පත්වුනි.

**භාෂාව හා ආගම පිළිබඳ දෘෂ්ටිකෝණය**

වාර්ගික අර්බුදයට හේතු වූ ප්‍රධාන කාරණාවක් ලෙස භාෂාව හඳුනාගත හැක. එනම්, එක් භාෂාවක් පමණක් පිළිගැනිමේ රාජ්‍ය ප්‍රතිපත්තිය බහු භාෂාමය සමාජයක යථාර්ථයක් හා නොගැලපෙන්නේය යන භයෙනි. ලංකාවේ ජාතිය ගොඩනැගිමේ මුල් අදියරේදි ත්‍රි භාෂාමය ප්‍රතිපත්තියක් සඳහා ශ්‍රී ලංකාව මනාපය පලකරේ නම් ගැටුම වළක්වා ගැනීමට බොහෝ දුරට හැකිවනු ඇති බව විචාරක මතයයි. භාෂාව පමණක් නොව ආගම පිළිබඳ කාරණයද වැදගත් තේමාවකි.

ආගමික විඥානය ඉහළ මට්ටමක පවතින විට බහුආගමික දේශයක් පාලනය කිරීමේදී එක් විශේෂ ආගමක් කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය දක්විම සාවද්‍ය වේ. (Amunugama, 1991)

උක්ත යථාර්ථයට එරෙහිව 1940 පමණ වනවිට සිංහල මහා සභාව ඉල්ලීම් 10 ක් ඉදිරිපත් කරමින් රටපුරා දැවැන්ත මහජන ව්‍යාපාර දියත් කළහ. ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලිම වුයේ රාජ්‍ය භාෂාව සිංහල වශයෙන්ද රාජ්‍ය ආගම ලෙස බුද්ධාගමද පිළිගත යුතු බවටයි. එක්සත් ජාතික පක්ෂය " සිංහල පමණක් ප්‍රතිපත්තිය" යටතේ 1956 මැතිවරණයට තරඟකර ජයග්‍රහණය කළේය. සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරිමට එරෙහිව දෙමළ නියෝජිතයන් උපවාසයක් ආරම්භ කලඅතර එය මැර ප්‍රහාර යොදවා ආණ්ඩුව විසින් මර්දනය කිරිම සමඟ රටපුරා දමිළ ජනතාව විරෝධතා දක්විමේ පසුබිමක් සකස්විය.

**බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම.**

1957 ජුලි 26 දා අත්සන් කල මෙම ගිවිසුමේ දි යෝජනා කිහිපයක් ගිවිසගන්නා ලදී. ඒ අතර,

* දමිළ භාෂාව සුළුතර ජාතික භාෂාවක් ලෙසට නිර්දේශ කෙටුම්පතට ඇතුළත් කිරීම.
* දමිළ භාෂාව උතුරු නැගෙනහිර පරිපාලන භාෂාව බවට පත් කිරීම.
* පුරවැසි පනත සංශෝධනය.
* රට සභා ක්‍රමය ස්ථාපිත කිරීම.
* රට සභා නියෝජිතයන් මැතිවරණයෙන් පත් කිරීමට විධි විධාන සැළසීම.
* විශේෂ බලතල ජනපද ක්‍රම හා බදු හා ණය සම්බන්ධ විධි විධාන. (සිල්වා, 2016)

ආදි යෝජනා විය. නමුත් මෙම ගිවිසුමට බෞද්ධ භික්ෂූන්ගේ හා ජේ.ආර්. ජයවර්ධනගේ ප්‍රධානත්වයෙන් විශාල විරෝධතාවක් ඉදිරිපත් වු හෙයින් ඔවුන් ඉදිරිපිටදීම ගිවිසුම ඉරා දැමීමට අගමැති බණ්ඩාරනායකට සිදුවිය. මෙය ගැටුම සඳහා බලපාන ලද තවත් මූල හේතුවක් ලෙස ගතහැක.

**සිංහල නිතිය හා දමිළ ජනතාව**

1960 න් පසු සිරිමාවෝ බණ්ඩාරනායක පාලන සමය සිංහල පමණක් රාජ්‍ය භාෂාව කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරිම දමිළ ජනතාව මත බලහත්කාරය ක්‍රියාත්මක කල අවස්ථාවකි. අධිකරණ කටයුතු සිංහල භාෂාවෙන් පමණක් කලයුතු යැයි පනතක් සම්මත කිරීම තුළ දමිළ නිතිඥයින්, විනිසුරුවරුන්, පැමිණිලිකරුවන් හා විත්තිකරුවන් කටයුතු කරන්නේ කෙසේද යන ගැටළුව ඇතිවිය. මෙම ප්‍රතිපත්තිය නිසා උතුරු නැගෙනහිර ඇතුළු විවිධ පළාත්වල වෙසෙන දමිළ ජනතාවට සිදුවූ අසාධාරණය සුළුපටු නොවේ.

ආණ්ඩුවේ සිංහල පමණක් ප්‍රතිපත්තියට උතුරේ මෙන්ම දකුණේ ජනතාව විරෝධතා පළකළහ. දමිළ දේශපාලන පක්ෂ ගාලු මුවදොර පැවැත් වූ සත්‍යග්‍රහණයට ආණ්ඩුව පහර දුන්හ.

(ගුණතිලක, 2001)

උතුරු නැගෙනහිර පවත්වන ලද සත්‍යග්‍රහවලට ද රජය ප්‍රතිචාර ලෙස හදිසි නිතිය ප්‍රකාශයට පත්කරමින් එම අවිහිංසාවාදි අරගල ප්‍රචණ්ඩත්වය යොදවා මර්දනය කලේය. මෙම මර්දනකාරි ප්‍රතිපත්තිය රජය විසින් අනුගමනය කලේ රජයට එරෙහිව කිසිදු සන්නද්ධ දේශපාලන ව්‍යාපාරයක් ක්‍රියාත්මක නොවන අවදියකය. මෙම තත්වයද ගැටුම් පරිසරයකට පදනම් සපයන ලදී.

**ඩඩ්ලි - චෙල්වනායගම් ගිවිසුම**

1965 දි එක්සත් ජාතික පක්ෂයේ ඩඩ්ලි සේනානායක හා පෙඩරල් පක්ෂයේ චෙල්වනායගම් අතර ඩඩ්ලි චෙල්වනායගලම් ගිවිසුම අත්සන් කරන ලදී. එම ගිවිසුමේ යෝජනා පහත පරිදි විය.

* උතුරු නැගෙනහිර පාලන හා වාර්තා කිරිමේ භාෂාව දමිළ භාෂාව කිරීමට දමිළ භාෂා විධි විධාන පනත  යටතේ පියවර ගැනිම.
* උසාවි භාෂා පනත සංශෝධනය කර උතුරු-නැගෙනහිර උසාවි කටයුතු දමිළ භාෂාවෙන් සිදුකිරිමට අවස්ථාව දිම.
* දිස්ත්‍රික් සභා පිහිටුවිම.
* ඉඩම් සංවර්ධන ආඥා පනත සංශෝධනය කර උතුරු නැගෙනහිර ඉඩම් ලබාදිමේ දි උතුරු නැගෙනහිර දමිළ භාෂාව කථාකරන ඉඩම් නැති පුද්ගලයන්ට හා දිවයිනේ වෙනත් ස්ථානවල පදිංචි දමිළ ජනතාවට වැඩි අවස්ථාවක් දිම. (ගුරුගේ, 2010)

එහෙත් මෙම ගිවිසුමද ක්‍රියාත්මක කිරිමට නොහැකි වුයේ 1956දි බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුමේ ප්‍රධාන හවුල්කරුවා වු ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂය බෞද්ධ භික්ෂුන්ද සමඟ එක්වී ගිවිසුමට එරෙහිව කටයුතු කරන්නට විමයි. මෙම ගිවිසුම ක්‍රියාත්මක නොවිමද ජනවාර්ගික ගැටුමේ මුල හේතුන් විග්‍රහයේදී වැදගත් සන්ධිස්ථානයක් වේ.

**දෙමළ භාෂා විධි විධාන පනත.**

1965 මාර්තු 24 වැනිදා අත්සන් කෙරුණු ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම යටතේ 1966 ජනවාරි 08 දෙමළ භාෂා විධිවිධාන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් ක්රන ලදී. මෙහි අදහස වන්නේ උතුරු නැගෙනහිර ප්‍රදේශ තුළ දමිළ භාෂාවෙන් වැඩ කටයුතු කිරීමේ අයිතිය ලබාදිය යුතු බවය. මෙය ජාතික වශයෙන් ස්වභාෂා තත්වය ඉල්ලිමට වඩා අවම තත්වයකි.

දෙමළ භාෂා විධිවිධාන පනත දෙමළ ජනතාවගේ අවම ඉල්ලිමක් බව වඩාත් තහවුරු වන්නේ, ලංකාවේ එකම රාජ්‍ය භාෂාව සිංහල විය යුතු යැයි ප්‍රකාශ කල 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ ක්‍රියාකාරිත්වයට හානියක් නොවන පරිදි යනුවෙන් එහි සඳහන් වීමෙනි.

(Abeysekara,Gunasighe, 1987)

එහෙත් මෙම පනත පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද අවස්ථාවේදිද විරුද්ධ පක්ෂය වු ශ්‍රී ලංකා නිදහස් පක්‍ෂ හා බෞද්ධ භික්ෂුන් ගෙනගිය විරෝධතාවයන්ගෙන් පැහැදිලි වුයේ තම අවම ඉල්ලිමටවත් කන්දිමේ සුදානමක් දකුනේ නායකයන් තුළ නොමැති බව දමිළ ජනතාවට තහවුරු විමය. දමිළ ජනතාවගේ අයිතිවාසිකම් පිළිබඳ ඉල්ලිම් මෙසේ දිගින් දිගටම ප්‍රතික්ෂේප විමේ ප්‍රතිඵලය වුයේ 70 දශකය වනවිට වෙනම රාජ්‍යයක් පිළිබඳ අදහස ඉස්මතු විමය.

මේවනතුරු දමිළ ජනතාව තම ප්‍රජාතන්ත්‍රවාදි සාමකාමි අරගල දියත් කළේ,

- භාෂා අයිතිය.
- අධ්‍යාපනයට ඇති අයිතිය.
- රාජ්‍යය පාලනයේ තමන්ට හිමි නියෝජිත බලය සහ හිමිකාරත්වයේ පංගුකාරකම.

යනාදි කරුණු උදෙසාය.

**වෙනම රාජ්‍යයක් පිළිබඳ අදහස.**

1970 මැතිවරණයට තරඟකල සී. සුන්දරලිංගම් හා ඩී. නවරත්නම් යන දේශපාලනඥයින් දෙදෙනා වෙනම රාජ්‍යයක් පිළිබඳ අදහස ඉදිරිපත් කලද පෙඩරල් පක්ෂය ඡන්ද දායකයන්ගෙන් ඉල්ලාසිටියේ රට දෙකඩකිරීමේ මෙම යෝජනාවට ඡන්දය නොදෙන ලෙසයි. මෙම මැතිවරණයෙන් සුන්දරලිංගම් අන්ත පරාජයටද පත්විය. වෙනම රාජ්‍යයක් පිළිබඳ අදහස් ඉදිරිපත් කළ දමිළ අපේක්ෂකයන් පැරදවිම සඳහා පෙඩරල් පක්ෂයේ දමිළ නියෝජිතයන්ම කටයුතු කිරීම ඉතිහාසයේ තවත් අවස්ථාවකි.

**1972 නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, එහි විධිවිධාන හා දෙමළ ජනතාව.**

1972 දී සමගි පෙරමුණු ආණ්ඩුවේ නව ව්‍යවස්ථාදායක මණ්ඩලය හමුවට දමිල ජනතාව වෙනුවෙන් පෙඩරල් පක්ෂය විසින්ද වෙනම යෝජනා කිහිපයක් ඉදිරිපත් වු නමුත් ඒවා ප්‍රතික්ෂේප කෙරිණ. එම යෝජනා :-

* ශ්‍රී ලංකාවට පෙඩරල් ආණ්ඩුක්‍රම ව්‍යුහයක් ලබාදිම.
* දමිළ භාෂා විධි විධාන පනත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරිම.
* දමිළ භාෂාව දමිළ සිසුන්ගේ අධ්‍යාපන මාධ්‍ය හැටියට පිළිගැනිම.

(සපුතන්ත්‍රි, 2001)

එහෙත් මෙම යෝජනා ප්‍රතික්ෂේප කරනු ලැබිම දමිළ ජනතාවගේ අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රමයක් යටතේ දිනාගැනිමට තිබෙන අවස්ථා පිළිබඳව දමිළ දේශපාලන පක්ෂ තුළ විශාල සැකයක් හා කළකිරිමක් ජනිත කිරීම කෙරෙහි බලපාන ලදී.

1972 ව්‍යවස්ථාව මගින් සොල්බරි ව්‍යවස්ථාවෙහි මගින් පනවා තිබු සුළුජාතික ආරක්ෂා විධි විධාන ඉවත්කරනු ලැබු අතර ව්‍යවස්ථා විධිවිධාන මගින් බලය බෙදාහැරිම හෝ බලය බෙදාගැනීම සම්බන්ධ ව්‍යවස්ථා රාමුවක් ඇතිකිරිමට අවකාශයක් නොවිය. ආණ්ඩුක්‍රමය තුළ උත්තරීතර ආයතනය වු ජාතික රාජ්‍ය සභාව බලතල කේන්ද්‍රිකරණ මුලධර්මය භාවිතා කළේය. එමගින් 1948 සිට ජනකොටස් අපේක්ෂා කරන ලද බලය විමධ්‍යගතකරණය කරන ලැබු ප්‍රාදේශිය පරිපාලන ක්‍රමයක් පිළිබඳ අදහස බිඳවැටිමකට ලක්විය. මෙම ව්‍යවස්ථාව යටතේ හඳුන්වා දෙනු ලැබු පරිපාලන හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හේතු කොටගෙන දෙමළ භාෂාව කථාකරන ජනතාවට විවිධ දුෂ්කරතාවයන්ට මුහුණදිමට සිදුවිය. එනම්, රාජ්‍ය අංශයේ රැකියාවලට පිවිසිම සිමාවීම, රජයේ රැකියාවල නිරත වු දෙමළ ජනතාවට උසස්විම් ලැබිමේ ඉඩකඩ අහිමිවිම යනදෑ දෙමළ ජනතාව සම්බන්ධයෙන් මෙම යුගයේදි උද්ගතවු උග්‍ර ගැටළු විය. විශ්ව විද්‍යාල ප්‍රවේශය සම්බන්ධව ඇතිකරනු ලැබු ප්‍රමිතිකරණය එම තත්වය උග්‍ර කළේය. භාෂාව පදනම්කරගත් ප්‍රමිතිකරණය දමිළ සිසුන්ට විශ්වවිද්‍යාලවලට ඇතුලත්වීමේ අවස්ථා අඩුකිරීමට බලපෑම නිසා තරුණ ප්‍රජාව තුළ ආණ්ඩු විරෝධයක් වර්ධනය

වන්නට විය. මෙම ප්‍රමිතිකරණය හරහා විශේෂයෙන් විද්‍යා පාඨමාලා සඳහා සුදුසුකම් ලත් දෙමළ ශිෂ්‍ය ප්‍රතිඵලය සීඝ්‍ර ලෙස පහත වැටුනි. එය පහත වගුව ආශ්‍රයෙන් තේරුම්ගත හැක.

**විශ්වවිද්‍යාලවල විද්‍යා පාඨමාලා සඳහා ඇතුළත් වූ දෙමළ ශිෂ්‍ය ප්‍රතිශතය.**

| | ප්‍රතිශතය (%) | | |
|---|---|---|---|
| **පාඨමාලාව** | **1972** | **1973** | **1974** |
| **විද්‍යා** | 33.6% | 29.5% | 20.9% |
| **වෛද්‍ය විද්‍යා** | 39.3% | 36.9% | 25.9% |
| **ඉංජිනේරු විද්‍යා** | 34.7% | 34.4% | 16.3% |

(Source :- Silva, 1979)

වගුවට අනුව 1972 විද්‍යා පාඨමාලා සඳහා ඇතුලත් කරගනු ලැබූ දෙමළ ශිෂ්‍ය ප්‍රතිශතය 33.6% කි. එය 1974 වන විට 20.9% ක් දක්වා අඩු වී ගොස්ය. මෙම තත්වය දෙමළ ජනතාවට කරනු ලැබූ සැලකිය යුතු අසාධාරණයක් ලෙස ඔවුන් ප්‍රකාශ කළේය. පසුව දිස්ත්‍රික් පදනම හඳුන්වාදුන්න ද ගැටුමකට එළඹීමේ පූර්ව සුදානමක් දෙමළ තරුණයින් තුළ රෝපණය වී තිබුනි. මෙම තත්වය ක්‍රමයෙන් ගැටුම වර්ධනය වීමට හේතු විය.

එමෙන්ම 1972 පෙඩරල් පක්ෂයට අමතරව ප්‍රධාන දමිළ පක්ෂ ගණනාවක් එක්ව ව්‍යවස්ථා සම්පාදක සභාවට ඉදිරිපත් කළ යෝජනා මාලාව ද කිසිදු වගවිභාගයකින් තොරව ප්‍රතික්ෂේප විය. එම යෝජනා අතර,

* දෙමළ භාෂාවට සම තැන දීම
* පුරවැසි පනතින් පුරවැසි භාවය අහෝසිවූවන්ට පුරවැසි භාවය ලබා දීම
* රජය එක් ආගමකට හෝ එක් භාෂාවකට විශේෂිකරණය නොකරන ලෞකික ආයතනයක් කිරීම
* සමානාත්මතා පදනමින් සියළු පුරවැසි අයිතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කිරීම.
* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කුල අසාධාරණය අහෝසි කිරීම

මේ අනුව දෙමළ ජනතාවට තම අයිතිවාසිකම් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් තුල දිනාගැනීමට තිබූ සියළු අවස්ථා ඇහිරෙමින් පැවතින. මේ තත්වය අර්බුදයට මූල හේතූන් ශක්තිමත් කළේය. ජනරජ ව්‍යවස්ථාවේ වැඩි රැකවරණ සිංහල ජනතාවට වූ හෙයින් එයට එරෙහිව උතුරු නැගෙනහිර සාමකාමී විරෝධතා සිදුවන විට සමගිපෙරමුණ ආණ්ඩුව ඊට ප්‍රතිචාර දක්වූයේ අත්අඩංගුවට ගැනීම හා මර්දනය සිදුකරමින්ය. උමා මහේෂ්වරන් හා කාසි ආනන්දන් වැනි තරුණ නායකයින් සිරගත කිරීම උදාහරණ ලෙස ගතහැක.

## රාජ්‍ය, ප්‍රජාතන්ත්‍රවාදය හා මර්දනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය.

රාජ්‍යය හා පාලනය පිළිබඳ ප්‍රශ්නය ජනවාර්ගික ගැටුමට හේතු වූ කාරණා විමසිමේදී වැදගත් වේ. රාජ්‍ය ව්‍යුහය ගැටුමට ප්‍රධාන හේතුවක් විය. (උයන්ගොඩ,2000). මෙම අදහසට අනුව රාජ්‍ය ව්‍යුහය රටේ දේශපාලනික ජනගහන විද්‍යාත්මක යථාර්ථයන්ට අනුචිතය. ඒ නිසාම රටේ දේශපාලනික ක්‍රියාදාමයට ඵලදායි ලෙස සහභාගි විමට සුළුතර වාර්ගික කණ්ඩායම් වලට නොහැක. ඒ අනුව රාජ්‍ය ක්‍රමයද අසමාන අවස්ථා සඳහා හේතු වි ඇත. එයද ගැටුමට සෘජුව ගැටුමට හේතු වූ තත්වයකි.

ප්‍රජාතන්ත්‍රවාදි ක්‍රියාමාර්ගයන් ලෙස හඳුනාගැනෙන සත්‍යග්‍රහ, උපවාස, උද්ඝෝෂණ, පෙළපාලි වැනි ක්‍රියාාමර්ග වලදී රාජ්‍ය ඊට ප්‍රතිචාර ලෙස යොදාගනු ලැබුයේ මර්දන උපාය මාර්ග නැතහොත් නිර්ප්‍රජාතාන්ත්‍රවාදි උපක්‍රම ලෙස වෙඩිතැබිම්, අත්අඩංගුවට ගැනිම් හා සිරගත කිරීම්ය. ඒ සඳහා තවත් උදාහරණයක් ලෙස 1974 යාපනයේ දමිළ භාෂා පර්යේෂණ සමුළුව මොහොතේ පොලිසිය සිදුකළ ප්‍රහාරයකින් රැස්ව සිටි දමිළ ජාතික නව දෙනෙකු ඝාතනය ගතහැක. මෙම අසහනය නැතහොත් පීඩන මානසිකත්වය දමිළ ජනතාව දේශපාලන ප්‍රචණ්ඩත්වයට පෙළඹීමට සාධකයක් විය.

භාෂාව, ආගම හා අධ්‍යාපනය වැනි ප්‍රතිපත්ති වෙතීන් දෙමළ ජනතාවට තමන් දෙවන පංතියක පුරවැසියන් (Second class citizenship) යන හැඟිම ජනිත කළේය. එමගින් දෙමළ ජනතාවට තමන් වෙනම ජාතියක්ය යන හැගීම සහ එම අරමුණ සාක්ෂාත් කරගැනිම සඳහා යුධ සටන්කාමිත්වය වෙත පිවිසිම ඇරඹුනි. ඒ අනුව 1975 වන විට යුධවාදි දෙමළ තරුණයෝ සංවිධානගතවිම ආරම්භ විය. (දික්වැල්ල, ප්‍රියන්ත හෙට්ටිආරච්චි,3003) ඒ අනුව පෙඩරල් පක්ෂය තවත් දමිළ පක්ෂ හතරක් සමඟ ඒකාබද්ධ වි 1972 දී දමිළ එක්සත් විමුක්ති පෙරමුණ ප්‍රකාශයට පත්කළ අතර පසුව 1976 මැයි මස 14 වැනිදා වඩුක්කෝඩෙයි ආසනයේ ජාතික සම්මේලනයක් කැඳවා දමිළ ජනතාවගේ නිදහස වෙනුවෙන් ඊලාම් රාජ්‍යයක් ඇතිකරගතයුතු බවට ප්‍රථම වරට ප්‍රකාශයට පත්කරන ලදි. (සපුතන්ත්‍රි,2001) එම පක්ෂය එකී තේමා පාඨය යටතේ 1977 මැතිවරණයට මුහුණ දී විරුද්ධ පක්ෂය බවට පත්වුහ.

1972 බලයට පත්වු ආණ්ඩුව ගෙන ගිය මර්දනකාරි ප්‍රතිපත්තියම 1978 බලයට පත් එක්සත්ජාතික පක්ෂ ආණ්ඩුවද ඉදිරියට ගෙනගිය අතර දමිළ ජනතාවගේ ප්‍රශ්නවලට මැතිවරණයට පෙර දී කී විසඳුම් යෝජනා ජයග්‍රහණයෙන් පසුව ඉටුකරනවා වෙනුවට ප්‍රචණ්ඩත්වය මුදාහැරියේය. 1979 දී පනවන ලද හදිසි නීතිය අනුව ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතෙහි උතුරු නැගෙනහිර 'ත්‍රස්තවාදය තුරන් කරලිමේ මෙහෙයුමක් ' දියත් කෙරිණ. ඒ තුළ දමිල තරුණයන්, මරා දැමීම, පහරදීම අත්අඩංගුවට ගැනිම් සිදුවි ඇත. ඒ වගේම වෙනම රාජ්‍යයක් ඉල්ලීම ඔස්සේ පාර්ලිමේන්තුවට තේරිපත් වු ද්‍රවිඩ පෙරමුණේ මන්ත්‍රීවරුන්ගේ මන්ත්‍රීධුර ඒ අය පාර්ලිමේන්තුවට නොපැමිණෙන් අහෝසි කළේය. ඒ තුල උතුරු නැගෙනහිර දමිළ ජනතාවගේ නියෝජනය බෙහෙවින් අඩපණ වි ගියේය.

ජාතිකත්ව ප්‍රශ්නයට විසුදුම් සෙවිම සඳහා යැයි යෝජනා කරන ලද දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය ක්‍රියාත්මක කිරිම සඳහා කරුණු සොයාබැලිමට කමිටුවක් පත්කල අතර එහි සාමාජිකත්වය ගැනිම බොහෝ පක්ෂ ප්‍රතික්ෂේප කරන ලදී. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදි අභිලාෂය මතහිඳ දමිළ එක්සත් විමුක්ති

පෙරමුණ සංවර්ධන සහා මැතිවරණයට තරඟ කළහ. නමුත් මෙම මැතිවරණයේදී පාලන බලයේ වූ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මැරබලය යොදා ඡන්දයේ ජයග්‍රහණයට උත්සහ දරුඅතර දැඩි ප්‍රචණ්ඩත්වයක් ව්‍යාප්ත විය. ඒ අතර,

* යාපනය හඳවත බඳු වූ මහජන පුස්තකාලය ගිනිතබා විනාශ කිරීම.
* ඊලනාඩු පුවත්පත් කාර්යාලය ගිනිතබා විනාශ කිරීම.
* ප්‍රචණ්ඩත්වය තුල යාපනයේ ඡන්දදායකයන් 140,000 කට ඡන්දය දැම්මට යාමට නොහැකි වීම.
* යාපනය පාර්ලිමේන්තු මන්ත්‍රී යෝගේෂ්වරන්ගේ නිවස හා තවත් නිවාස 200 ක් ගිනිතබා විනාශ කිරීම. ( Silva, 2016)

ආදි සිදුවීම් විය. දකුණේ පාලකයන් කෙරෙහි අල්ප හෝ විශ්වාසයක් දමිළ ජනතාව ගැන තිබුනිනම් මෙම සිදුවීම් වලින් එය අහෝසි විය. අළුයට ගිණි පුපුරුමෙන් තිබු ප්‍රජාතන්ත්‍රවාදි විරෝධි පෙළඹීම් කරලියට ඒමට අවශ්‍ය වාතාවරණය එයින් පැදින. කෙසේ හෝ 1983 ජුලි මාසයේ යාපනයේ දෙමළ සටන්කාමීන් විසින් රජයේ සොල්දාදුවන් 13 දෙනෙකු ඝාතනය කිරිමත් සමගින් ගැටුම ආරම්භ විය. ඒත් සමඟම එක්සත්ජාතික පක්ෂ ආණ්ඩුව දමිළ සංහාරයකට මගපාදාගත්තේය.

**තිම්පු සාකච්ඡා (1985)**

ජනවාර්ගික ගැටුමට තිරසාර විසදුම් සෙවිමේ අරමුණු ඇතිව 1985 එවකට පැවති සියළු දේශපාලන පක්ෂවල සාමාජිකත්වයෙන් භූතානයේ තිම්පු නුවරදී සාකච්ඡාවක් පවත්වන ලදී. එයට EROS, PLOT, LTEE, TELO, TULF සහ EPRLF යන පක්ෂවල නියෝජිතයෝ සහභාගි වි ඇත. එහිදි වූ යෝජනා අතර,

* දෙමළ ජනතාව ජාතියක් හැටියට පිළිගැනීම
* නිජබිම් සංකල්පය පිළිගැනීම
* දමිළ ජනතාවගේ ස්වයං නිර්ණ අයිතිය පිළිගැනීම
* පුරවැසි අයිතිය පිළිගැනීම
* දමිළ ජනතාවගේ ප්‍රජාතාන්ත්‍රවාදි අයිතින් පිළිගැනීම (ගුරුගේ, 2010)

තිම්පු සාකච්ඡාවලට සහභාගිවුවත් තිම්පු ප්‍රතිපත්ති පිළිබඳ ගැඹුරු හා තියුණු සංවාදයක් ඔවුන් අතර පැවත නොමැති අතර ජේ.ආර්. ජයවර්ධනගේ ආණ්ඩුව යෝජනා ප්‍රතික්ෂේප කරමින් ප්‍රචණ්ඩත්වය මැඩපැවැත්විමේ ක්‍රියාමාර්ගය කෙරෙහි යොමු විය.

සරණාගතයින් වශයෙන් දහස් ගණන් දමිළ ජනතාව දකුණු ඉන්දියාවට පළායාමත් සමඟ මෙන්ම උතුරෙහි තරුණ නැගිටිම් හා රාජ්‍ය මර්දනය සමඟ මේ වනවිට ඉන්දියාවේ මැදිහත්විමේ පසුබිමක් නිර්මාණය විය. ඒ අනුව ඉන්දිය අගමැති රජිව් ගාන්ධි හා ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිවරයාගේ එකඟත්වයෙන් ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කළහ. මෙම ගිවිසුම ප්‍රකාරව දමිළ

සන්නද්ධ ව්‍යාපාර අයුධ අතහැර ප්‍රජාතන්ත්‍රවාදි ප්‍රවාහයට එක්වීම අපේක්ෂා කෙරිණ. මේ යටතේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එමින් පළාත් සභා ස්ථාපිත කරන ලදී.

**13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය.**

මෙම සංශෝධනය ජනවාර්ගික අර්බුදයට පිළියමක් ලෙස ගෙන ආ අතර මෙමගින් සිදුවූයේ මධ්‍යම ආණ්ඩුවේ බලතල පළාත්සභා වලට පැවරීමයි. ඒ අනුව 1987 අංක 42 දරණ පළාත්සභා පනත සම්මතකර මධ්‍යම රජයේ සිට පළාත් ඒකක වෙත බලය බෙදාහැරීය මෙය වාර්ගික අර්බුදය විසඳීමේ අනෙකුත් ප්‍රයාත්නයන්ට සාපේක්ෂව වැදගත් පියවරක් වූහ. නමුත් ගැටුම හා සම්බන්ධ ඍජු පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් තොරව ගොඩනගනු ලැබූ මෙම යාන්ත්‍රණය සාර්ථක පිළියමක් නොවිය. මෙම සංශෝධනයට අනුගත වෙමින් පැවති පළාත්සභා මැතිවරණයේදි EPRLM නායක වර්ධරාජා පෙරුමාල් උතුරුනැගෙනහිර පළාත්සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා විය. ගැටුම හා සම්බන්ධ පාර්ශවයන් සහමතිකභාවයකට යොමුකර ගැනීමට පළාත් සභා ක්‍රමය අසමත්විය. (දික්වැල්ල, ප්‍රියන්ත, හෙට්ටිආරච්චි, 2003) ඒ වගේම එය වැඩිකාලයක් ක්‍රියාත්මක වූයේ උතුරුනැගෙනහිර නොව සිංහල බහුතර පළාත්වලය.

**1990 - 2000 දශකය තුල ජනවාර්ගික ගැටුම විසඳීමට ගත් ප්‍රයත්න**

1989 ජනාධිපතිවරණයෙන් ජයගත් ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ පාලන කාලය තුල ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. 1991 දි ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ පුරෝගාමිත්වයෙන් පාර්ලිමේන්තුව විසින් 'මංගල මුණසිංහ' තේරීම් කමිටුව පත්කලේ ගැටලුවට විසඳුම් සෙවීමටය. නමුත් මෙම කමිටුවට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත්ජාතික පක්ෂය ඉදිරිපත් කළ යෝජනාත්, දමිළ පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාත් අතර පුළුල් පරස්පරතා විය. ඒ තුල එය සාර්ථක නොවිය. ප්‍රේමදාස ජනාධිපතිවරයා හා LTTE සංවිධානය අතර සාකච්ඡා ආරම්භ වුවත් සාකච්ඡා මාස 14 කින් බිඳ වැටුණි. (බණ්ඩාර,1999). 1994 බලයට පත් පොදුජන එක්සත් පෙරමුණු රජය ද LTTE සංවිධානය සමඟ සාකච්ඡාවන්ට එළඹි අතර, 1994 ඔක්තෝබර් ජනාධිපති ලේකම් බාලපටබැඳිගේ ඇතුළු LTTE සංවිධාන න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් අතර සාකච්ඡා ආරම්භ කළහ. නමුත් 1995 අප්‍රේල් 19 වන දා LTTE සංවිධානය ත්‍රිකුණාමල වරායට පහරදීම හා නාවික සෙබළුන් 11 දෙනෙකු ඝාතනය සමඟ සාම ක්‍රියාදාමය අසාර්ථක වී ගියේය. 1995 දී පොදුපෙරමුණු රජය බලතල විමධ්‍යගත කිරීම පිළිබඳ යෝජනාවලියක් ඉදිරිපත් කළ අතර මෙයට විවිධ දේශපාලන පක්ෂ විරෝධය පෑහ. පසුව ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ඇරයුම මත ගැටුම් නිරාකරණය සඳහා තෙවෙනි පාර්ශවයක් ලෙස මැදිහත්වීමට නෝර්වේ රජය ඉදිරිපත්වූහ. ඒ පොදුපෙරමුණු රජය හා LTTE අතර එකඟත්වය ඇති කිරීමටය.

කෙසේ හෝ වසර 2000 දීද තවත් ප්‍රයත්නයක් දැකගතහැකි විය. එනම් පොදු පෙරමුණ හා එක්සත් ජාතික පක්ෂ එක්ව නව ව්‍යවස්ථා කෙටුම්පතක් සම්පාදනයයි. නමුත් මෙහි ජනාධිපතිවරියගේ බලයේ පැවැත්ම වෙනුවෙන් වෙන විධිවිධාන එක්කර ඇතැයි චෝදනා කරමින් එක්සත් ජාතික පක්ෂය

එය සම්මත කිරීමට සහය නොදුන්හ. 1994 - 1995 කාලය තුල රජය සහ LTTE සංවිධානය අතර පැවති සාකච්ඡා ස්ථිරසාර විසඳුමක් ලබාදිම තෙක් වර්ධනය නොවුනද දෙපාර්ශවයේම යෝජනාමත රජය මගින් ජනාධිපති කාර්යසාධක බලකායක් පිහිටුවීමත් රජය සහ LTTE නියෝජිතයන්ගෙන්යුත් ප්‍රතිසංවර්ධන අධිකාරියක් පිහිටුවීමේ යෝජනාවත් සම්මතවීම වැදගත් පියවරයන් විය.

**අන්තර්වාර පාලන යෝජනාව**

2000 දී පොදුපෙරමුණ ආණ්ඩුව විසින් ඉදිරිපත් කළ ව්‍යවස්ථා කෙටුම්පතට අනුව යෝජිත අන්තර්වාර පාලනය වසර 10 ක් වු අතර 2001 එක්සත්ජාතික පක්ෂය විසින් ඉදිරිපත් කරන ලද මැතිවරණ ප්‍රකාශණයෙන් කියා සිටියේද උතුරු නැගෙනහිර සඳහා අන්තර් පාලනයක් ලබාදෙන බවයි. එහෙත් 2002 අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙන් පසුව අන්තර්පාලන යෝජනාව යටපත්වී වෙනත් යෝජනා සාකච්ඡාවට ලක්විය. අන්තර්වාර පාලනය ක්‍රියාත්මක වනුයේ ස්ථිර බලතලබෙදීමේ ව්‍යුහයක් සකස්කරනතුරු වු අතර LTTE, පොදුජන එක්සත් පෙරමුණ හා එක්සත් ජාතික පක්ෂය පොදුවේ යෝජනාව පිළිගත්තත් ඒ සඳහා අවශ්‍ය ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා දකුණේ දේශපාලන පක්ෂ අතර එකඟතාවක් නොවීය. බොහෝ ප්‍රමාදවීමෙන් පසු එහි යෝජනා LTTE සංවිධානය වෙත යැවුවද එය ප්‍රතික්ෂේප කරමින් LTTE සංවිධානය රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා වෙත සිය ස්ථාවරය දක්වු සංදේශයක් භාරදෙන ලදී. LTTEයේ යෝජනා 2003 අගෝස්තු 31 රජයට භාරදුන් වහාම විපක්ෂය වන පොදු පෙරමුණ හා ජනතා විමුක්ති පෙරමුණ එක්සත් ජාතික පක්ෂය රට බෙදනවා යැයි ප්‍රකාශ කරන ලදී.

**එල්ටිටිඊ ය සහ රජය අතර අවබෝධතා ගිවිසුම**

2001 දී එක්සත්ජාතික පක්ෂය ජයග්‍රහණයෙන් පසු නොර්විජියානු මැදිහත්වීම ද ඇතිව රජය හා එල්ටිටිඊ සංවිධානය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කෙරිනි. එහි අරමුණ ලෙස සඳහන් වුයේ ආයුධ සන්නද්ධ එදිරිවාදිකම් අවසානයකට ගෙනඒම සහ කල්පවත්නා විසඳුමක් ඇතිකරගතහැකි සාකච්ඡා සඳහා සුදුසු පරිසරයක් නිර්මාණය කරගැනීම යන කරුණය. මෙයට තමාගේ අනුමැති නොමැති බවට කරන ලද ජනපතිණියගේ චෝදනාව, නෝර්වේ මැදිහත්කරුවන්ගේ ක්‍රියාකලාපයට එල්ල වු චෝදනා, එල්ටිටිඊ එකම නියෝජිතයා ලෙස පිළිබඳව වු යෝජනාව ආදී විවේචන එල්ල විය. දීර්ඝකාලිනව පැවති මිලිටරි ග්‍රහණය යම් ප්‍රමාණයකට ලිහිල් කරන ක්‍රියාමාර්ග පිළිබඳ එකඟතාවන්ට එළඹීම ද මෙම අවබෝධතා ගිවිසුම තුල විය. ඒ වගේම 2001 දෙසැම්බර් එල්ටිටිඊ සංවිධානය සටන්විරාමය ඉදිරියට ගෙන යන අතර දකුණේ ජනතාවට පිඩාකාරිවන මිලිටරි ක්‍රියාවන්ගෙන් ඈත්වීමට තීරණය කරන ලදී. 2002 සැප්තැම්බර් සිට ජනවාර්ගික ගැටලුවට විසඳුම් ලෙස එල්ටිටිඊ සංවිධානය හා රජය අතර වූ සාකච්ඡා පහත පරිදි කැටිකොට ගත හැක.

| වසර සහ දිනය | ස්ථානය | තේමාව |
|---|---|---|

| | | |
|---|---|---|
| 2002 සැප්තැම්බර් 16 - 18 | තායිලන්තය | උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල මානුෂවාදී ප්‍රතිසංස්කරණ සඳහා ඒකාබද්ධකාර්ය සාධක බලකායක් ස්ථාපිත කිරීම. |
| 2002 ඔක්තෝබර් 31- නොවැම්බර් 03 | තායිලන්තය | දේශපාලන ගැටළු හා තියුණු බව අඩුකිරීම හා මානුෂවාදී කටයුතු වෙනුවෙන් උපකමිටු ගොඩනැගීම |
| 2002 දෙසැම්බර් 2- 5 | නෝර්වේ | එක්සත් ශ්‍රී ලංකාවන් තුළ දේශපාලන විසඳුමක් සඳහා වූ තීරණයක් පිළිබඳ ගවේෂණය |
| 2003 ජනවාරි 6 - 9 | බැංකොක් තායිලන්තය | මූලික මානුෂවාදී ප්‍රමුඛතා පිළිබඳ ක්‍රියාත්මක කිරීම් |
| 2003 පෙබරවාරි 7 - 8 | ජර්මනිය | මානව හිමිකම් වලට අදාළ වූ ගැටළු |
| 2003 මාර්තු 18 - 21 | ජපානය | |
| 2003 අගෝස්තු 18 | ප්‍රංශය | අන්තර්වාර පරිපාලනය |

(ගුණසිරි, 2005)

තායිලන්තයේ පැවැත්වූ පළමු සාකච්ඡාවලදී කාර්ය සාධක බලකාය පිහිටවූ අතර බිම්බෝම්බ ඉවත් කිරීම හා අවතැන් වූවන් නැවත පදිංචිකිරීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කෙරිණ. 2002 තායිලන්තයේ පැවති දෙවනවටයේදී ඒකාබද්ධ කාර්ය සාධක බලකාය උතුරු නැගෙනහිර මානවවාදී සහ පුනරුත්ථාපන අවශ්‍යතා පිළිබඳ අනු කමිටුව (SIHRN) බවට පත්කල අතර එම කමිටුවෙහි ප්‍රමුඛ වගකිම් පහත පරිදි විය.

* අවතැන්වූවන් නැවත පදිංචිය
* යුද්ධයෙන් විපතට පත් වූ දරුවන් හා වැන්දඹුවන් පුනරුත්ථාපනය
* පුද්ගලික දේපළ නිදහස් කිරීම, ආර්ථික කටයුතු නැවත ඇරඹීම, ගැටුම් නැවත ඇතිනොවීමට කටයුතු කෙරෙන උප කමිටු පිහිටු විම (ගුණසිරි, 2005)

2002 ඔස්ලෝහිදී පැවැත්වූ තුන්වැනි වටයේ සාකච්ඡා වටයේ සිට 2003 ජපානයේ හාකෝන්හි පැවැත්වූ 6 වන සාකච්ඡා වටය දක්වා ගනුලැබූ වැදගත් තින්දු කිහිපයක් මෙසේය.

* එක්සත් ලංකාවක් තුළ ෆෙඩරල් ව්‍යුහය මත අභ්‍යන්තර ස්වයං නිර්මාණය අයිතින් පිළිගනිමින් විසඳුම් යෝජනා කිරිම.
* උතුරු නැගෙනහිර නැවත ගොඩනැගිම් අරමුදලක් පිහිටුවිම.
* LTTE ය යුනිසෙෆ් සංවිධානයේ එකඟත්වය ඇතිව ළමා ජිවිත නැවත ප්‍රකෘති තත්වයට පත්කිරීම සඳහා ක්‍රියාකාරි සැළැස්මක් ඇති කිරිම.
* එක්සත් ජාතින්ගේ නැගෙනහිර නැවත ගොඩනැංවිමේ අරමුදල කඩිනමින් පිහිටුවිම.

* සාම ක්‍රියාවලිය සම්බන්ධ මානව හිමිකම් සඳහා මඟ සැළසීමට ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ හිටපු මහ ලේකම් ඉයන් මාටින්ට ආරාධනා කරීම.
* තම සංවිධානයට ළමුන් බඳවා නොගැනිමට පොරොන්දු විම.
* අධිආරක්ෂිත කලාප වල ගැටුම් නැවත ඇති නොවීම සහ සාමාන්‍ය තත්වය උදාකිරීමේ උප කමිටුව අක්‍රිය තත්වයට පත්ව තිබීම නිසා LTTEය එම කමිටුවෙන් ඉවත්වීමට තින්දු කිරීම.

කෙසේ හෝ 2003 අප්‍රේල් 02 වන දින එල්ටිටිඊ සංවිධානය විසින් අගමැති රනිල් වික්‍රමසිංහ වෙත එවු ලිපියක සඳහන්වුයේ තම සංවිධානය කිසියම් කාලයක් සාම සාකච්ඡාවලට සහභාගි විමෙන් වැළැකිසිටින බවය. එහෙත් සාකච්ඡා මාර්ගික ක්‍රියාවලියක් සඳහා සංවිධානය කැපවී සිටින බවද ඔවුන් විසින් අවධාරණය කෙරිණ. සාකච්ඡාවලින් ඉවත්වීම පිළිබඳව ඔවුන් දැක් වු හේතු මෙසේය.

- ටොකියෝ ආධාර සමුළුවට සුදානම්විම සඳහා වොෂින්ටන්හි පැවති ජාත්‍යන්තර ආධාර සමුළුවට එල්ටිටිඊ සංවිධානය ආරාධනා නොකිරිම පිළිබඳ අප්‍රසාද එලකිරිම
- දමිළ ජනයා ජිවත්වන ප්‍රදේශ සාමාන්‍ය තත්වයට පත්කිරිමේ කටයුතු ප්‍රමාද කිරීම
- අවතැන්වුවන්ගේ දුක්ගැනවිලිවලට ප්‍රතිචාර නොදැක්විම (ගුණසිරි,2005)

2005 අවසන් වනවිට ජනාධිපතිවරණයේ කැඳවීමත් සමඟ ගැටුම නව මානයකට පරිවර්තනය විය. මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයාගේ පදවිප්‍රාප්තිය සමඟම එල්ටිටිඊ සංවිධානය ප්‍රහාර දියත් කිරිම වඩා වේගවත් කලහ. කෙසේ හෝ මහින්ද රාජපක්ෂ සමයේ පළමු සාම සාකච්ඡා වලට 2006 පෙබරවාරි ස්විට්සර්ලන්තයේ ජිනිවාහි පැවැත්වුනි. නමුත් අප්‍රේල් මස පැවැත්විමට සුදානම් කල ඊළඟ සාකච්ඡා වටය එල්ටිටිඊය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. පසුව නැවතත් 2006 ජුනි මස දෙවන සාකච්ඡා වාරයක් නෝර්වේ ඔස්ලෝහිදි පැවැත්වුහ. මෙම සාකච්චා වාර ද්විත්වය ප්‍රධාන ගැටුම් පාර්ශවයන් සහභාගි වු සාම සාකච්ඡා අවස්ථා ද්විත්වය විය. මේ වනවිට ගැටුම් පාර්ශවයන් ද්විත්වයම වඩා උච්ච ස්ථානයකට පැමිණ තිබු හෙයින් යුදමය ක්‍රියාමාර්ග කෙරෙහි නිරන්තර යොමුවිය. තවදුරටත් සාකච්චාමය විසඳුම් කෙරෙහි විශ්වාසය නොතබමින් සන්නද්ධ ගැටුමකින් විසඳුම් අත්පත්කරගත හැකිය යන මතය තුළ චර්යාත්මක වශයෙන් ක්‍රියාවේ යෙදීමට රජයත් එල්ටිටිඊ සංවිධානයත් කටයුතු කල අතර 2008 ජනවාරි මස ඒවනවිට අත්පත් කොට තිබූ සටන්විරාම ගිවිසුම ඉවත්කර ගැනිමට මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා කටයුතු කරනු ලැබුහ. 2006 මැද භාගය වනවිට එල්ටිටිඊය විසින් නැගෙනහිර පළාත් මාවිල්ආරු සොරොව්ව වසා දැමිමෙන් පසු එය නැවත ශ්‍රී ලංකා හමුදාව හරහා විවෘත කිරීමට ජනාධිපතිවරයා කටයුතු කල අතර 2007 ජුලි වනවිට මුළු නැගෙනහිර පළාතම එල්ටිටිඊ පාලනයෙන් මුදවාගන්නා ලදී. මින් ආරම්භවී පසුව තවත් වසර දෙකක් අති භයානක යුධමය ක්‍රියාමාර්ග තුළ ඍජු යුද්ධමය ගැටුමක් සිදුකොට 2009 මැයි මස වනවිට උතුරු පළාත ද මුදවාගන්නා ලදී. එහි නායක වේළුපිල්ලේ ප්‍රභාකරන්ගේ ඝාතනය සමඟ එල්ටිටිඊ සංවිධානය යුධමය වශයෙන් පරාජයට පත්කිරිමට ශ්‍රී ලංකා රජයට හැකියාව ලැබුනි.

කෙසේ හෝ පශ්චාත් යුධ පරිසරය තුළ ආණ්ඩුවට අන්තර්ජාතික වශයෙන් මානව හිමිකම් සම්බන්ධ දැඩි අභියෝගයක් එල්ල වු අතර රජය විසින් ඒ හා සම්බන්ධව කියා සිටියේ ඊට හොඳම විසඳුම උගත් පාඩම් කොමිසම් වාර්තාව (LLRC) බවය. එහි සටන් විරාම ගිවිසුමේ සිට යුද්ධයේ නිමාව දක්වාවු කාලය තුළ සිදුකරන ලද නිරික්ෂණ හා  නිර්දේශ අන්තර්ගත වු අතර ඒත් සමඟම එක්සත් ජාතින්ගේ මානව හිමිකම් කවුන්සලයට ප්‍රතිචාර දැක්විමේ අවස්ථා උදාවිය.

මේ ආකාරයට දැක්විය හැකි  ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමේ මුලහේතුන් හා එය විසදිමට ගත් මුලික ප්‍රයත්න තුලින් පැහැදිලිවන්නේ එය හුදෙක් කෙටිකාලින මුල හේතුන් මත හටනොගත් ගැටුමක් බවයි. ඒ ඒ ආණ්ඩු දමිළ ජනතාව සම්බන්ධව දැක්වු දෘෂ්ටිය හා ක්‍රියාමාර්ගයන්හි ස්වභාවය මත ගැටුමක් සඳහා වන සාධක ඒකරාශීවෙමින් අවසානයේ යුධමය ගැටුමක් දක්වා විකාශය වු අයුරු මින් පැහැදිලි වේ. මුලහේතු මෙන්ම ඊට සමාන්තර විසදිමට ගන්නා ලද උපායමාර්ගයන් හි සාධනීය නිශේධනිය භාවයන් ද මේ තුල මුලික වශයෙන් පැහැදිලිකොට දක්වා ඇත.

wkqrdO f;kakfldaka

foaYmd,k úoHd wdpd¾h